NLDB

# ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - වාර්ෂික වාර්තාව 2011

# தேசிய கால்நடை வன அபிவிருத்தி சபை - வருடாந்த அறிக்கை 2011

# NATIONAL LIVESTOCK DEVELOPMENT BOARD - ANNUAL REPORT 2011

| | |
|---|---|
| මහින්ද චින්තන | 3 |
| අමාත්‍යතුමන්ගේ පණිවිඩය | 4-5 |
| නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවිඩය | 6-7 |
| දර්ශණය | 8 |
| මෙහෙවර | 9 |
| පොදු අභිමතාර්ථ | 10 |
| ප්‍රධාන ක්‍රියාකාරකම් | 11 |
| ආයතනික තොරතුරු | 12-13 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 14-15 |
| කළමනාකාර කණ්ඩායම | 16 |
| සභාපතිතුමන්ගේ පණිවිඩය | 18-21 |
| නියෝජ්‍ය සභාපතිතුමන්ගේ පණිවිඩය | 22-25 |
| මෙහෙයුම් සමාලෝචනය | 26-41 |
| පස් වසරක ප්‍රගතිය | 42-47 |
| මූල්‍ය ප්‍රකාශන | 49-74<br>75-104<br>105-128 |

ජාතික පශු සම්පත් මණ්ඩලය ව්‍යාපාරික කටයුතු අරඹා හතලිස්
වසරට පා තබන්නේ ශ්‍රී ලංකාවේ පශු සම්පත් කර්මාන්තයේ පෙර
ගමන්කරු ලෙස සාඩම්බර අතීතයකට හිමිකම් කියමිනි. පශු සම්පත්
හා පොල් වගාවන් එකට මුසුවූ ගොවිපල 30 ක් මණ්ඩලය යටතේ
පාලනය කෙරේ. ගොවීන්ට සිද්ධාන්තික මෙන්ම ප්‍රායෝගික දැනුම
ලබාදෙන පුහුණු මධ්‍යස්ථානයක් ද මණ්ඩලය විසින්
පවත්වාගෙන යනු ලැබේ



ඉදිරි වසර පහ තුළදී  දැනට සිටින 340,000 පමණ වන දේශීය
කිරි ගව සම්පත  දෙගුණයක් කරමි  ඒ සඳහා දැනටමත් ආරම්භ කර
ඇති කිරි දෙනුන් බෝ කිරීමේ ගොවිපොල සංඛ්‍යාව ඉහළ නැංවීමට
පියවර ගනිමි.
දේශීය සහ නැවුම් කිරි පානය සම්බන්ධයෙන් වන සමාජ ආකල්පවල
විශාල වෙනසක් සිදු විය යුතු බව මගේ විශ්වාසයයි.

**මහින්ද චින්තන - ඉදිරි දැක්ම 2010**





## අමාත්‍යතුමන්ගේ පණිවිඩය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 2010 අප්‍රේල් මාසයේ මාගේ අමාත්‍යාංශය යටතට පැමිණීමෙන් පසුව මේ දක්වා ලබා ඇති දියුණුව පිළිබඳව මම ඉමහත් සතුටට පත් වෙමි.

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් රජයේ මහින්ද චින්තන වැඩපිළිවෙල මත පදනම් වෙමින් සාර්ථකව සිය වැඩසටහන් සංවිධානය කිරීම පිළිබඳව ද මම ඉමහත් ප්‍රීතියට පත්ව සිටිමි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන්නේ පශු සම්පත දියුණු කිරීමයි. ඒ සඳහා ඔවුන් විසින් ගන්නා ලද අරුත්බර පියවරයන් පිළිබඳව මෙම වාර්තාව තුළ සවිස්තරාත්මකව සාකච්ඡා වේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය උසස් ගණයේ අභිජනන අමුද්‍රව්‍ය ගොවීන් වෙත අඩු මිලට ලබාදීම සාර්ථකව සිදු කර තිබෙන අතර එමගින් සාර්ථක ලෙස ගොවීන්ගේ ජාලයක් නිර්මාණය කොට තිබේ.

ජාතික වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 2011 ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන උළෙලෙදී පශු සම්පත් හා මත්ස්‍ය කර්මාන්ත අංශය යටතේ මණ්ඩලය ලබා ගත් ජයග්‍රහණය වෙනුවෙන් උණුසුම් සුබ පැතුම් එක් කිරීමට කැමැත්තෙමි. මෙම ජයග්‍රහණය ඉදිරි වසර වලදී වඩාත් යහපත් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කාර්යය මණ්ඩලයට පිටුබලයක් වනු ඇතැයි මම විශ්වාස කරමි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ලාභ ලබන රජයේ ආයතනයක් බවට පත් කිරීමට සිය දහඩිය ශ්‍රමය හෙළූ අධ්‍යක්ෂක මණ්ඩලයටත් ප්‍රධාන සහ කලාපීය කාර්යාලයන්හි කාර්යය මණ්ඩල වලටත් මාගේ හද බැති ප්‍රණාමය පුද කර සිටිමි.

**ආරුමුගම් තොණ්ඩමන් පා.ම.**
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍ය



# නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවිඩය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුව සඳහා අත්‍යාවශ්‍ය ආයතනයකි. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ග්‍රාමීය අංශයේ ගොවි ප්‍රජාවට ඉතාමත් සමීපව හිඳිමින් ඉතාමත් වැදගත් කාර්යයක් සිදු කරමින් ඔවුන් හට මෙම අත්‍යාවශ්‍යය කර්මාන්තයේ නියැලීම සඳහා සහය ලබා දෙයි.

පසුගිය වසර කිහිපය තුළදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පාරිභෝගිකයන් වෙත සිය සේවා වර්ධනය,කිරීමට වඩාත් අවධානය යොමු කොට තිබේ. ආකර්ශණීය අලෙවි සැල් පාරිභෝගිකයන්ගේ දෛනික අවශ්‍යතා වලින් විශාල කොටසක් සාධාරණ මිලකට සපුරයි. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නිෂ්පාදන පාරිභෝගිකයන්ට පහසු ලෙස සිල්ලර වෙළඳසල් වෙතින් ද ලබා ගැනීමට අවකාශ සලසා ඇත. ප්‍රශංසනීය මට්ටමකට නිෂ්පාදන පරාසය ගෙන යෑම මණ්ඩලයේ අරමුණයි.

උසස් වර්ගයේ සතුන් අභිජනනය සඳහා ආනයනය කිරීම හා බෙදා හැරීම තුළ ගොවීන්ට වඩාත් හොඳ අස්වැන්නක් හා ආදායමක් ලබා ගැනීමට විශේෂයෙන්ම ගවයන් ආනයනය හේතු වී ඇත.

පාඩු ලැබූ ආයතනයක් ලාබ ලබන ආයතනයක් බවට පත් කිරීමට ආයතනයේ කාර්යක්ෂම කළමනාකරණය දැඩිව බලපා තිබේ. කාර්යක්ෂම ලෙස හා කැපවීමෙන් යුතුව සේවයේ නියුතු නව අධ්‍යක්ෂක මණ්ඩලයට හා කාර්යය මණ්ඩලයට ඒ පිළිබඳව මගේ හද පිරි සුභාශිංසන පුද කරමි.

**එච්.ආර් මිත්‍රපාල පා.ම.**
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය

# දර්ශණය

ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වයන්
වැඩි දියුණු කිරීම සඳහා
ගුණාත්මක අභිජනන ද්‍රව්‍ය හා කෘෂි නිෂ්පාදන
නිපදවන ශ්‍රී ලංකාවේ හොඳම ස්ව පැවැත්මක්
ඇති ආයතනය බවට පත්වීම

## මෙහෙවර

පශු සම්පත් හා කිරි නිෂ්පාදනයෙන් රට සවයංපෝෂිත කිරීමේ අරමුණ ඇති ව ගොවීන් වෙත බෝ කිරීම සඳහා සතුන් නොකඩවා නිකුත් කිරීමට සාධාරණ කාල පරිච්ඡේදයක් තුල දී පශු සම්පත් කටයුතු දියුණු කිරීම.

ආයතනයේ පිරිවැටුම හා ලාභදායිත්වය වර්ධනය කිරීම සඳහා නව තාක්ෂණය උපයෝගි කර ගනිමින් පශුසම්පත් හා ක්ෂිර නිෂ්පාදන සංවර්ධන කිරීම.

රටේ කෙටිකාලීන භෝග නිෂ්පාදන වැඩසටහනට අනුබල දෙනු පිණිස තෝරාගත් ගොවිපොල වල කෙටි කාලීන භෝග වගාකිරීම.

පශුසම්පත් හා කෘෂිකාර්මික කෙෂ්ත්‍රයේ ප්‍රශස්ත නිෂ්පාදන මට්ටම් ලඟා කර ගැනීම.

පශුසම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපලවල් ක්‍රමය තුලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට හා පරිසර හිතකාමී වගා ක්‍රම අනුගමනය කිරීම.

තෘප්තිමත් ශ්‍රම බලකායක් ඇතිව විවිධ කෘෂි දේශගුණික කලාප තුල ස්ව පැවැත්මකින් යුතු පශු සම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපලවල් සමූහයක් පවත්වාගෙන යෑම.



# පොදු අභිමතාර්ථ

- පොල් මූලාශ්‍රිත කර්මාන්ත වලින් ලැබෙන අතිරික්ත මුදල් උපයෝගි කර ගනිමින් එහි පැවැත්ම සඳහා ගොවිපලවල් වල සියලුම ක්‍රියාකාරකම් ප්‍රශස්ත මට්ටමකින් පවත්වා ගෙන යාම.
- සාර්ථකව වෙළඳපොල තරඟ කිරීම සඳහා පිරිවැය අඩුකිරීමට හා නිෂ්පාදනය දියුණු කිරීමට වඩා හොඳ කළමනාකරණ ප්‍රතිපත්ති සමග නව තාක්ෂණය විශේෂඥ දැනුම සහ ප්‍රාග්ධනය හඳුන්වා දීම.
- පුද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව මෙම ගොවිපොල - ඒකක ලාභදායී ව්‍යාපාර බවට පත් කිරීම සඳහා වඩා හොඳ අලෙවි උපාය මාර්ග සමග නව වෙළඳපළක් ඇතිකිරීමේ හැකියාව සොයා බැලීම.

# ප්‍රධාන ක්‍රියාකාරකම්

- පශු සම්පත් අභිජනනය හා සංවර්ධනය
- බෝ කිරීම සඳහා හොඳ තතත්වයේ සතුන් සාධාරණ මිළකට ගොවීන්ට නිකුත් කිරීම
- උපරිම ලාභයක් ඉපයීම සඳහා ප්‍රශස්ත මට්ටමින් පොල් වගාව පවත්වාගෙන යාම
- හැකියාව ඇති ස්ථාන වල පශු සම්පත් භෝග ඒකාබද්ධ ගොවිපලවල් ක්‍රියාත්මක කිරීම
- ගොවීන්ට,පාසල් සිසුන්ට,කෘෂි කර්මාන්තයේ නියැලි නිලධාරීන්ට සහ විශේෂයෙන් කුඩා පරිමාණයේ සතුන් ඇති කරන්නන් හට පුහුණු වැඩසටහන් හා ප්‍රදර්ශන පැවැත්වීම
- සාධාරණ මිලකට හොඳ තත්ත්වයේ ගොවිපල නිෂ්පාදන සැපයීම සඳහා අලෙවිසැල් පවත්වාගෙන යාම
- ඉහළ ලාභ පරතරයක් ලබා ගැනීම සඳහා ගොවිපලවල නිෂ්පාදිත අමුද්‍රව්‍ය භාවිතා කරමින් වටිනාකම එකතු කරන ලද භාණ්ඩ නිපදවීම
- ජනතාව අතර නැවුම් එළකිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා ජනතාවට නැවුම් එළකිරි අලෙවි කිරීම

# ආයතනික තොරතුරු

**නම / තත්ත්වය**

ජාතික පශු සම්පත් මණ්ඩලය - පශු සම්පත් හා
ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ නීතිගත සංස්ථාවක්

**ආරම්භය**

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂි සංස්ථා පනත යටතේ
1973 දී පිහිටුවනු ලැබීය. 1974 පටන් ක්ෂේත්‍ර කාර්යයන් ඇරඹිණි.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

ආර්. එම්. ඇල්ලෙගල ( සභාපති )
ලක්ෂමන් හුලුගල්ල ( නියෝජ්‍ය සභාපති )
ඒ. ආර්. අනුර ජයසිරි
කේ. එම්. එම්. සිරිවර්ධන
වෛද්‍ය සැම්සන් එල්. ඒ. ඩැනියල්
එස්. මර්වින් ඩබ්ලිව්. පෙරේරා
එස්. බාලචන්ද්‍රන්
රවීන්ද්‍ර මනෝජ් ගමගේ
ආර්. අශෝක්කුමාර්
ආචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා

**ප්‍රධාන විධායක නිලධාරී**

ඒ. සී. ඒ. මුණාවීර
සාමාන්‍යාධිකාරී

**ප්‍රධාන කාර්යාලය**

අංක. 40 නාවල පාර
නාරාහේන්පිට
කොළඹ 5
දුරකථනය: + 94 11 2501701/2
ෆැක්ස්: + 94 11 2502695
ඊ මේල්: info@nldb.gov.lk
වෙබ් අඩවිය: http://www.nldb.gov

බැංකු: මහජන බැංකුව

# අධ්‍යක්ෂ මණ්ඩලය



ආර් එම් බී ඇල්ලෙගල
සභාපති



ලක්ෂ්මන් හුළුගල්ල
නියෝජ්‍ය සභාපති



ඒ ආර් අනුර ජයසිරි
ක්‍රියාකාරී අධ්‍යක්ෂක



කේ එම් කේ සිරිවර්ධන



වෛද්‍ය සැම්සන් එල් ඒ ඩැනියෙල්



එස් මර්වින් ඩබ්ලියු පෙරේරා



එස් බාලචන්ද්‍රන්



රවීන්ද්‍ර මනෝජ් ගමගේ



ආර් අශෝක්කුමාර්



ආචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා



## කළමනාකාර කණ්ඩායම

**එස් ඒ එස් තෙවරප්පෙරුම මිය**
පරිපාලන කළමනාකාරිණී

**එම් ඩී කරුණාතිලක**
කළමනාකරු (නිරීක්ෂණ හා ඇගයීම්)

**කේ කේ ආර් කන්නන්ගර**
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)

**ඩී මැදගෙදර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංස්ථා මෙහෙයුම්)

**ඒ සී එච් මුණවීර**
සාමාන්‍යාධිකාරී

**එන් පී ඩී ඒකනායක**
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

**එම් පද්මසිරි**
සහකාර කළමනාකරු (මූල්‍ය)

**එම් රාජකරුණා**
කළමනාකරු (මූල්‍ය)




ප්‍රධාන කාර්යාලය හා අලෙවි සැල



## සභාපතිතුමන්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාව තුළ අත්‍යාවශ්‍ය වූ කර්මාන්තයක් නගා සිටුවීමට දශක සතරක් තුළ සිදු කොට තිබෙන්නා වූ කැප වූ සේවය රාජ්‍ය ආයතනයකට ඉතාමත් භාරධූර වූ වගකීමකි. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය දේශයේ පශු සම්පත් කර්මාන්තය වෙනුවෙන් සැබවින්ම  මුදුන්පත් කොටගෙන තිබෙනුයේ එවන් වූ තත්ත්වයකි.

රජයේ ආර්ථිකය දියුණු කිරීමේ සැලැස්ම තුළ සක්‍රීය කොටස්කරුවකු වන ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, ග්‍රාමීය ආර්ථිකයේ  ප්‍රධාන කොටසක් ලෙස හඳුනා ගෙන තිබෙන්නා වූ කිරි පට්ටි සහ පශු සම්පත් කර්මාන්ත සංවර්ධනය සඳහා සිය මූලික අවධානය යොමු කර තිබේ. මෙම වසරේදී මිලියන 200 ක වාර්තාගත ආදායමක් අප ලබා තිබුණ ද අපගේ ප්‍රධාන අරමුණ වූයේ වාණිජමය ජයග්‍රහණයන්ට වඩා ග්‍රාමීය ගොවියාගේ ජීවන තත්ත්වය නගා සිටුවීමයි.

ජාතික වානිජ මණ්ඩලය විසින් සංවිධානය කර තිබූ 2011 වාර්ෂික ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන උලෙළේ දී අප ආයතනය හඳුනා ගනු ලැබීම තුළ අපි නිහතමානී ආඩම්බරයක් ලැබුවෙමු. එහිදී අප පශු සම්පත් හා මත්ස්‍යය කර්මාන්ත අංශය සඳහා ලැබූ කුසලතා සම්මානය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මෙතෙක් ලැබූ ප්‍රථම ජාතික සම්මානය වන අතර එය අපගේ අනාගත ප්‍රයත්නයන් සඳහා වඩාත් ධෛර්යයක් ගෙන දෙනු ඇත.එමෙන්ම මෙම ජයග්‍රහණය අප කාර්යය මණ්ඩලයට වඩාත් උසස් ඉලක්කයන් සොයා යමින් ඒවා දිනා ගැනීමට දිරිගැන්වීමක් වනු නො අනුමාන ය.මෙම වසරේ දී අපගේ කාර්යය සාධනය ඉතාමත් වැඩිකර ගැනීමටත් ජයග්‍රහණයන් කරා වඩාත් පිවිසෙන්නටත් අපි වෙහෙසෙමු. 2011 වසරේ සම්මානය ලබා ගැනීම සඳහා කැප වූ කාර්යය මණ්ඩලයේ සියලු දෙනා වෙත මාගේ අවංක ස්තූතිය පුද කර සිටිමි.

මෙම වසරේ මුල් කාර්තුව තුළ ඕස්ට්‍රේලියාවෙන් පැමිණි ප්‍රථම ගවයන් තොගයත් සමග අප විශාල ඉදිරි පිම්මකට එලඹ තිබේ. මෙම ගවයන් ආනයනය කිරීමේ අරමුණ වූයේ කිරි අස්වැන්න වැඩි කරවීම හා ගොවින් ගුණාත්මක බවින් ඉහල වඩාත් වැඩි අස්වැන්නක් ලබා දෙන ගවයන් හිමිකරුවන් කිරීම තුළින් ඔවුන්ට ආපසු වැඩි අස්වැන්නක් ලබා දීම මගින් උසස් ජීවන තත්ත්වයක් ලබා දීමයි. මෙය ග්‍රාමීය ගොවීන් මහා පරිමාන කිරි නිෂ්පාදනයට නැඹුරු කිරීම සඳහා තැබූ ඵලදායී පියවරක් ලෙස පෙන්වා දිය හැකිය.

අප නිෂ්පාදනයන් ගුණාත්මක බවින් මෙන්ම පාරිභෝගිකයන් හට ආකර්ශණීය බවින් ද වර්ධනය විය යුතු බව අපි අවබෝධ කරගෙන සිටිමු. පෞද්ගලික අංශය විසින් නව නිෂ්පාදන හඳුන්වා දීමට හා ප්‍රබල ප්‍රචාරණ ක්‍රම තුලින් පාරිභෝගිකයන් දැනුවත් කිරීම ක්ෂණිකව සිදු කිරීම නිසා වෙළඳපොල තුළ තරගකාරී වීමට නම් මෙය අත්‍යාවශ්‍යය.
මේ තුළ අප අලෙවි සැල් වලට වඩාත් ආකර්ෂණීය පෙනුමක් ලබා දීමටත් බෙදා හැරීම් වර්ධනය කිරීමටත් කටයුතු යොදා තිබේ. නවතම ප්‍රවනතාවන් අනුව යමින් අප විසින් “Delite” නමින් ටෙට්‍රා ප්‍රමාණයේ කිරි පැකට්ටුවක් හඳුන්වා දෙන ලදි. ගුණාත්මක භාණ්ඩ වඩාත් සුව පහසු පරිසරයක් තුළ ලබා දීම සඳහා අප දරන උත්සාහය පාරිභෝගිකයන් විසින් ඉතාමත් අගය කරනු දක්නට ලැබීම ඉතාමත් සතුටට කරුණකි. අප ප්‍රධාන කාර්යාලය අසල පිහිටුවා තිබෙන්නා වූ අලෙවි සැල් ද්විත්වය ඉතා ඉහල අනුග්‍රහයක් ලබන අතර ඒවායේ විකුණුම් ද ආකර්ශණීය ලෙස ඉහල ගොස් ඇත.

යන්ත්‍රෝපකරණ, ආම්පන්න සහ ගොවිපල අලුත්වැඩියාව සඳහා ද සතුන් සඳහා වඩාත් ගැලපෙන වටපිටාවක් ඇති කිරීම සඳහා ද සංචාරක නිවෙස් අළුත්වැඩියාව සඳහා ද 2011 දී අප සිදු කළ ප්‍රාග්ධන ආයෝජනයන් ආදායම් ලබා දීම දැනටමත් ආරම්භ කොට ඇත.

සියලුම මට්ටම් වල සේවකයන් කණ්ඩායම් හැඟීමෙන් යුතුව වැඩ කිරීම තුළ මෙම සියලූ ජයග්‍රහණ ලබා ගත හැකි වූ අතර එ සෑම දෙනා වෙත මාගේ අවංක ස්තුතිය පුද කර සිටිමි.

ගරු ආරුමුගම් තොන්ඩමන් අමාත්‍යතුමන්ට ද එච්. ආර්. මිත්‍රපාල නියෝජ්‍ය අමාත්‍යතුමන්ට ද අමාත්‍යංශ ලේකම් සහ අමාත්‍යංශයේ සියලුම නිලධාරීන්ට ද ඔවුන් ලබා දුන් සහය හා මග පෙන්වීම පිළිබඳව ස්තූතිවන්ත වෙමි. එමෙන්ම අධ්‍යක්ෂක මණ්ඩලයේ හා කලමණාකරණ කමිටුවේ සැලකිල්ල සහ සහයේගය නොවන්නට මෙම අරමුණු ලඟා කර ගැනීම සඳහා ආයතනය මෙහෙයවීම මා හට සිහිනයක් වන්නට ඉඩ තිබුණි.
නැවත වතාවක් මාගේ කාර්යය මණ්ඩලය දැක් වූ කැපවීම පිළිබඳව ස්තූතිවන්ත වීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර ඉදිරියේදීත් ඔබගේ සහය තුළ වඩාත් ඉහල අරමුණු කරා ලඟා වීමට හැකි වනු ඇති බව මම දැඩිව විශ්වාස කරමි.

**රංජිත් ඇල්ලේගල**



## නියෝජ්‍ය සභාපතිතුමන්ගේ පණිවිඩය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නව අධ්‍යක්ෂක මණ්ඩලය ලෙස කෙටි කාලයක් තුළ කැපී පෙනෙන වර්ධනයක් ප්‍රතිලාභ තුල මෙන්ම ක්‍රියාකාරකම් තුල ද වාර්තා කිරීමට හැකි වීම සැබවින්ම ආශ්වාදනීය කරුණකි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සැලකිය යුතු මට්ටමකින් දේශීය ආර්ථීකයේ පශු සම්පත් අංශය වර්ධනය කිරීමට දායක වන අතර එය ග්‍රාමීය ගොවි ප්‍රජාවට සිය ජීවන තත්ත්වය උසස් කර ගැනීමට උපකාරී වී ඇත. අප විසින් ඔවුන් වෙත අඩු මිලට උසස් වර්ගයේ සතුන් අභිජනනය සඳහා ලබා දී ඇත. එමෙන්ම පුහුණු වීමේ පහසුකම් ලබා දී තිබෙන අතර සියලු කටයුතු වඩාත් හොඳින් සිදු කිරීම සඳහා ලබා දිය හැකි සියලු දිරි ගැන්වීම් ලබා දී තිබේ.

අප ආයතනය නව ලොව ප්‍රවනතාවන් හා යමින් පශු සම්පත් කාර්මාන්ත සංවර්ධනය සඳහා නවීන ක්‍රම හා තාක්ෂණය භාවිතා කිරීම සඳහා සැලසුම් කොට තිබේ. උදාහරණ ලෙස කිරි දෙවීමේ යාන්ත්‍රණය තුළ අප සියලුම එළදෙනුන්ගේ කිරි අස්වැන්න පිළිබඳව වෙන් වෙන් වශයෙන් වාර්තා පවත්වාගෙන යන අතර ඒ තුළ යම් එළදෙනක් අපේක්ෂිත මට්ටමට කිරි ලබා නොදෙන්නේ නම් වාර්තා අධ්‍යයනයෙන් ඊට හේතු සොයා ගත හැකිය.

සක්‍රීය කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවය වටහා ගැනීම තුළ නිරතුරුව ඔවුන්ට අවශ්‍යය පහසුකම් වර්ධනය කිරීම ද සිදු වේ. රක්ෂණ වැඩසටහන්, අභ්‍යන්තර හා බාහිර සෞඛ්‍ය හානි පූරණය, ක්‍රීඩා හා සමාජීය වැඩසටහන් යනාදිය ඔවුන් ධෛර්යමත් කිරීම සඳහා ඉවහල් වී ඇත. ආගමික වැඩසටහන් හා උත්සව අවස්ථාවන් වලදී මෙන්ම ක්‍රීඩා තරග වලදී ද ඔවුන්ගේ සහභාගීත්වය, ඔවුන්ගේ උද්‍යෝගය මනාව පිළිබිඹු කරයි.

පශු සම්පත් සංවර්ධන සඳහා රජයේ ප්‍රයත්නයන් තුළ අපි සක්‍රීය දායකයන් වෙමු. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මැණික්පාලම ගොවිපලෙහි සිටින ඕස්ට්‍රේලියාවෙන් ආනයනිත ගව පට්ටි කිරි නිෂ්පාදනයේදී දැනටමත් ඉතාමත් දිරි ගන්වන සුළු ප්‍රතිඵල පෙන්වීමට පටන් ගෙන ඇති අතර එය දිනකට ලීටර 8,000 ක් පමණ වේ. මෙතෙක් දෛනිකව වාර්තා වූ කිරි නිෂ්පාදනයේ උපරිම අගය වූයේ ලීටර 1,000 ත් 1,200ත් අතර ය.

නැවුම් කිරි භාවිතය ජනප්‍රිය කිරීම සඳහා ගත් අපගේ උත්සාහයන් ඵලහරිත බව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අලෙවි සැල් වලින් අප නිෂ්පාදන ලබා ගන්නා පාරිභෝගිකයන් ගණන දින දින ඉහළ යාමෙන් පෙනී යයි. අප නිෂ්පාදන වඩ වඩාත් වෙළඳපොල වෙත යොමු කොට ඇති අතර අප ගොවිපලවල් වලින් තවත් නවතම නිෂ්පාදන වෙළඳපොලට හඳුන්වා දීමට ද සැලසුම් සැකසෙමින් පවතී.

අප 'මහින්ද චින්තන' වැඩපිළිවෙල ගුරු කොටගෙන ක්‍රියාත්මක වන අතර පශු සම්පත් හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය ගරු ආරුමුගම් තොන්ඩමන් මැතිතුමන්ගේ නිරන්තර නායකත්වය ද හද බැතියෙන් අගය කරමු.

සභාපති රංජිත් ඇල්ලේගල මැතිතුමන් මගපෙන්වීම තුළ, සහෘද අධ්‍යක්ෂ මාණ්ඩලිකයන්ගේ හා ජ්‍යෙෂ්ට කලමනාකරණයේ සහයෝගයෙන් ක්‍රියාත්මක වන අභිප්‍රේරිත කාර්ය මණ්ඩලයක් අප සතුව ඇත. ප්‍රධාන කාර්යාලීය කාර්ය මණ්ඩලයේ මෙන්ම උප කාර්යාලයන්හි කාර්ය මණ්ඩල වල ද සහයෝගයෙන් ඉදිරි වසර වලදී වඩාත් යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු.

**ලක්ෂමන් හුලුගල්ල**

## මෙහෙයුම් සමාලෝචනය





පශු සම්පත් අංශය දියුණු කිරීම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අරමුණයි. මෙම අරමුණ සාක්ෂාත් කිරීම සඳහා ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් පශු සම්පත් ගොවි ප්‍රජාව වෙනුවෙන් ලබා දිය හැකි උපරිම සේවාවන් ලබා දීම සඳහා නිරන්තරයෙන් ක්‍රියා කරමින් සිටියි.

### වැඩි දියුණු වන අභිජනන තොග

සමාලෝචනයට බඳුන් වන වසර තුළ, අභිජනන තොග වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලාංකා කිරි පට්ටි සංවර්ධන වැඩසටහන යටතේ සැලසුම් කළ වැඩසටහන ක්‍රියාවට නැගීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සුවිශේෂී කාර්යයක නොකඩවා නිරතවිය.

එමෙන්ම එම වසර තුළ, තෝරා ගත් ගොවිපල කිහිපයක උසස් වර්ගයේ ගව පට්ටි ඔවුන්ගේ ජානයන් සංරක්ෂණය වන ලෙස නුමුහුන් ස්වරූපයෙන්ම පවත්වාගෙන යනු ලැබීය. ජර්සි, ෆ්‍රිසියන්, සහිවාල්, කිලාරි සහ තිල්ලි රවි යන උසස් ගව වර්ග ඒ අතරට ඇතුලත් ය. රටේ විවිධ ප්‍රදේශ වල ගොවීන් හට මුහුන් කළ සතුන් ලබා දීමට මණ්ඩලයට මේ ක්‍රමය තුළ හැකියාව ලැබී ඇත.

ගව, කුකුලු, ඌරු සහ එළු යන තොග වල විවිධත්වය වර්ධනය වීම තුළ ගොවීන් හට සිය ආදායම් වැඩි කර ගැනීමට මග සැලසුණු අතර එයින් වාසි සහගත තත්ත්වයක් ඇති වී තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අභිජනන තොග සඳහා විශාල ඉල්ලුමක් ඇති කර තිබේ.

ගුණාත්මක අභිජනන අමුද්‍රව්‍ය සැපයීම තනි පශු ගොවීන් වෙනුවෙන් පමණක් සීමා කොට නැත. ඊට අමතරව පශු සම්පත් නිෂ්පාදකයන්ගේ සංගම්, රාජ්‍ය නොවන සංවිධාන, දිවි නැගුම හා සමෘද්ධිලාභීන් මෙන්ම ඉදිරියට යන රජයේ හා පෞද්ගලික අංශයේ ව්‍යාපෘති සඳහා ද ගුණාත්මක අමුද්‍රව්‍ය ලබා දීම සිදු කෙරුණි. ගවයන්, මී හරකුන්, එළුවන්, බැටළුවන්, ඌරන්, හාවුන් සහ කුකුලන් ඉතාමත් සුලු මුදලකට ලබා දෙන අතර නිෂ්පාදනයන් පුළුල් පරාසයක පැතිර පවතී.

වසර තුළ, වැඩි කිරි අස්වැන්නක් ලබා දෙන ෆ්‍රිසියන්, ජර්සි සහ ජර්සි හා ෆ්‍රිසියන් මිශ්‍ර ගර්භනී වැස්සියන් 500ක් ඕස්ට්‍රේලියාවෙන් ගෙන්වීමට අවශ්‍ය සැලසුම් සකසනු ලැබීය. මෙය 2012-14 වසර තුනක කාලය තුළ ආනයනය කිරීමට නියමිත 4,500ක් වූ ගවයන් තොගයේ ප්‍රථම කාණ්ඩයයි.

මෙම ගවයන් අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කළ මැණික්පාලම ගොවිපල තුළ ගාල් කරනු ඇත.



## කුකුළු පාලනය

අධික බිත්තර මිල අඩු කිරීමේ උපක්‍රමයක් ලෙස, 2010 වසරේදී දිනක් වයසැති කිකිලියන් ආනයනය ආරම්භ කළ අතර පශු සම්පත් හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යංශය සහ ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ මග පෙන්වීම යටතේ දිවි නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ බෙදා හරින ලදි.

2011 වසර තුළ මාරවිල ගොවිපල මගින් කිකිලියන් 73,000ක් බෙදා හරින ලදි. දිවි නැගුම වැඩසටහනේ දෙවන පියවර යටතේ මාසයක් වයසැති කිකිලියන් විවිධ පළාත් සභා වෙත බෙදා හැරිනි.
මේ අතරතුර මාරවිල ගොවිපලේ දෙවන ඉන්කිව්බේටරය අළුත්වැඩියා කෙරුණු අතර කුඩා කිකිලියන් නිෂ්පාදනය කිකිලියන් 400,000 සිට කිකිලියන් 800,000 දක්වා ඉහල ගොස් ඇත.



## කෘත්‍රිම සිංචනය

ගැහැනු සතුන්ගේ උපත් ප්‍රමාණය වැඩි කිරීම සඳහා ආනයනිත සිංචනය කළ ධාතු භාවිතය, සමාලෝචනයට බඳුන් වු කාලය තුළ සාර්ථකව සම්පූර්ණ කරන ලදි. මාත්‍රාවන් 200ක් ඇමරිකා එක්සත් ජනපදයෙන් ගෙන්වූ අතර සමස්ත තොගයම භාවිතා කොට ඇත. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපල බොහොමයක් මෙම වැඩසටහන තුළ ආවරණය කොට තිබෙන අතර ඒවා නිරන්තර අධීක්ෂණයට ලක් වේ.

නවතම වාර්තා අනුව මේ වන විට ගර්භනී සතුන් 89ක් සිටියි.
සැලසුම් කර ඇති වැඩසටහනට අනුව වසු පැටවුන් 50%කට ගැහැනු සතුන්ගේ උපත් ප්‍රමාණය 93%කින් වැඩි විය යුතු වේ.



## කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම

පසුගිය වසර කිහිපය තුළ කිරි නිෂ්පාදනයේ අඩුවීමක් දක්නට ලැබිණි. කිරි නිෂ්පාදනය 2010 වසරේදී ලීටර මිලියන 3.2 වූ අතර 2011 දි ලීටර මිලියන 2.8 දක්වා පහත වැටුණි. මීට ප්‍රධාන හේතුව වූයේ 2012 වසරේ රටින් ගවයන් ගෙන්වීමට ලකලෑස්තිවීමක් වශයෙන් ගොවිපල වල සිටි ගවයන් ගොවීන් වෙත විකුණා දැමීමයි.
2012 දී ශක්‍යතාවය වැඩි අභිජනනය කළ සතුන් පැමිණි විට කිරි නිෂ්පාදනය ඉහල යනු ඇත.වර්තමානයේ ලීටර 7 ක් පමණ වන ගවයකුගේ දිනක කිරි අස්වැන්න ඊට සාපේක්ෂව අවම වශයෙන් කිරි ලීටර 20 ක් වනු ඇති බවට ගණන් බලා ඇත.මෙසේ සැලකිය යුතු මට්ටමේ කිරි නිෂ්පාදනයක් ඉදිරි වසර වලදී ලබා ගැනීමට අපේක්ෂිතය. දිනකට කිරි ලීටර 7000 කින් ඉහල යනු ඇතැයි අපේක්ෂිතය.






## නව කිරි දෙවීමේ යන්ත්‍ර සවි කිරීම

සිය මෙහෙයුම් වලදී නව තාක්ෂණය හඳුන්වා දීමට මණ්ඩලය දරන්නා වූ ප්‍රයත්නය තුළ නවතම කිරි දෙවීමේ උපකරණ ආනයනය කොට තිබේ. 2011 වසරේදී බෝපතලාව සහ දයගම ගොවිපල වල එම අළුත් යන්ත්‍ර සවි කරන ලදි.

ඉහල අස්වැන්නක් ලබා දෙන ගවයන් ආනයනය කිරීම සමග නිෂ්පාදන යාන්ත්‍රණය ඉහළ දැමෙනු ඇත. නව යන්ත්‍ර 2012 දී මෙරටට ඕස්ට්‍රේලියාවෙන් පැමිණෙන නව අභිජනනිත සතුන් අපේක්ෂාවෙන් මැණික්පාලම ගොවිපලේ සවි කිරීමට නියමිතය.

## තෘණ හා සත්වාහාර බීජ ආනයනය කිරීම

සමාලෝචනයට බඳුන් වන වසර තුළ ඉහල පෝෂණයක් සහිත තෘණ සහ සත්වාහාර බීජ කිලෝ ග්‍රෑම් 5700 ආනයනය කළ අතර ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපල අතර ඒවා බෙදා හරින ලදි. මෙය ගොවිපල වල ඇති තෘණ භූමි වල ඇති අඩු පෝෂණීය තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා සිදු කරන ලදි. අක්කර 1026ක බ්‍රිකාහිරියා ඩිකම්බන්ස්, මොම්බාසා ගිනියා සහ TD58 යන බීජ විශේෂ වගා කොට තිබේ. සැලසුම්ගත ආකාරයට ඉතිරිව තිබෙන බීජ වලින් තවත් අක්කර 600 ක් 2012 වසරේදී වගා කිරීමට නියමිතය.

පසුගිය වසර පහක කාලය තුළ කිරි ගොවිපල වල තෘණභූමි වර්ධනය ඉහල වර්ධනයක් පෙන්වා ඇත. එය 2007 දී අක්කර 273 ක් ද 2010 දී අක්කර 741 ක් ද වූ අතර 2011 වන විට අක්කර 1000 ඉක්මවා ගොස් ඇත.

## සහයෝගී ගොවිපල ක්‍රමය

මණ්ඩලය විසින් පාලනය කරනු ලබන ගොවිපල ජාලය මෙහිදී සුවිශේෂී බන්ධනයක් වී තිබේ. රට පුරා විසිර පවතින පශු සම්පත් සහ බෝග මිශ්‍රිත කළ ගොවිපල 30 ක් ඇත. ගොවිපල වලින් බහුතරයක් (15 ක්) පොල් ත්‍රිකෝණයේ පිහිටා තිබෙන අතර අටක් වියලි කලාපයේ පිහිටා ඇත. සමතුලිත ලෙස ගොවිපල හතරක් කඳුකරයේ ද තුනක් රට මධ්‍යයේ ද පිහිටා ඇත.
සමාලෝචනයට බඳුන් වන වසර තුළ මණ්ඩලය පොල් ප්‍රධාන බෝගය ලෙස යොදා ගනිමින් සිය සහයෝගී ගොවිපල වැඩසටහන පුළුල් කරන ලදි. මිලියන 20 ක් වන වාර්ෂික පොල් නිෂ්පාදනය 2011 වසරේදී ද එලෙසම පවත්වා ගෙන යන ලදි. 2010 නිෂ්පාදනය මිලියන 20.6 ක්වූ අතර ඉතා සුලු ප්‍රමාණයකින් 2011 නිෂ්පාදනය අඩුවී වසර කෙලවරදී මිලියන 19.94 ක් ප්‍රමාණයක් වාර්තාවිය. පොල් වගාව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත විශාල ආදායමක් ලබා දෙයි.

මීට අමතරව ගොවිපල වල ගවයන් ඇති කිරීම හා කෙසෙල්, ගස්ලබු වැනි බෝග වර්ග හා එලවළු වගා කිරීම සිදුවේ.





## පර්යේෂණය හා සංවර්ධනය

පොල් ඵලදාව වැඩි කිරීම සඳහා ක්‍රියාමාර්ග හඳුන්වා දීමට මණ්ඩලය විසින් සැලසුම් කර ඇති වැඩසටහන යටතේ සිරින්ගපත සහ මාර්ටින් ගොවිපල වලදී කාබනික පොහොර අත්හදා බැලීම් ඝන සහ දැව යන මාධ්‍යය ද්විත්වයෙන්ම සිදු කර තිබේ. අත්හදා බැලීම් සාර්ථක වුවහොත් පසෙහි පවත්නා ව්‍යුහය වැඩි දියුණු කිරීම තුළ ගොවිපලකින් ලැබෙන ඵලදාව මෙන්ම පොල් ඵලයක බර ද වැඩි වනු ඇත.

2011 නොවැම්බර් මස සිරින්ගපත ගොවිපලේ යක්විල කොට්ඨාශයේ අක්කර 72 ප්‍රදේශයක් තුළ දියර පොහොර භාවිතය පිළිබඳ අත්හදා බැලීම් සිදු වූ අතර ඒවා සමීපව අධ්‍යනය කෙරෙමින් පවතී

## ගොවීන් පුහුණු කිරීම

දිගන පිහිටා ඇති මධ්‍යම ප්‍රදේශ පශු සම්පත් සංවර්ධන කේන්ද්‍රය විවිධ ගොවීන්ට ගැලපෙන පරිදී සැකසූ වැඩසටහන් පවත්වයි කිරි නිෂ්පාදනය සුළු පරිමාන පශු සම්පත් කලමනාකරණය බෝග වගාව තොග භෝග සමොධානය කළ ගොවිපල ක්‍රමය හතු වගාව යනාදී පාඨමාලා මේ තුළ ඇතුලත්ය

සමාලෝචනයට බඳුන් වූ කාල සීමාව තුළ පැවැත්වූ නේවාසික වැඩසටහන් 110 ක් සඳහා 4000 ක් පමණ දෙනා සහභාගී වූ අතර මෙම වැඩසටහන් වල ජනප්‍රියතාවය වර්ධනය වෙමින් පවතී. 2011 වසරේදී නේවාසික පුහුණු පාඨමාලා 21 ක් පැවැත්වූ අතර 567 දෙනෙක් ඒ සඳහා සහභාගිවූහ. ඔවුන් සඳහා යටිතල පහසුකම් සහ පුහුණු පහසුකම් සපයන ලදි. ඒවා තුළ ගව, එළු, බැටලු සහ කුකලු පාලනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඇතුලත් විය. අස්වැන්න නෙලීම හා මී මැසි පාලනය වැනි විශේෂිත මාතෘකා පිළිබඳව අරාධිත දේශකයින් සිය දේශන මෙහෙයවන ලදී









## පාරිභෝගික සේවය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පාරිභෝගිකයා වෙත ගුණාත්මක නිෂ්පාදන සාධාරණ මිලකට ලබා දීමට මහත් පරිශ්‍රමයක් දරයි.

ඉහල ගුණාත්මකභාවයක් පවත්වාගෙන යන අතරතුරදීම වසර ගණනාවක් තුළ මණ්ඩලය සිය නිෂ්පාදන පරාසය පුළුල් කොට තිබේ. නැවුම් කිරි නිෂ්පාදන පාරිභෝගිකයාට ලබා ගැනීමට හැකියාව සලසා ඇත.

වෙළඳපලේ පොල් ගෙඩියක සිල්ලර මිල ඉතාමත් ඉහල යන විට සාධාරණ මිලකට අප ගොවිපල වලින් නිරතුරුව පොල් ලබා දීමට මණ්ඩලය විශේෂ වෙහෙසක් දැරීය. මෙම සේවාව පාරිභෝගිකයන්ගේ මහත් අගය කිරීමට ලක් විය. අප විකුණුම්හල් පාරිභෝගිකයන් හට ආකර්ශනීය හා ඒවා තුලට පැමිණ විවේකීව සිය අවශ්‍යතා සපුරා ගත හැකි පරිදි නවීකරණය කර තිබේ.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නිෂ්පාදන පරාසය තුළ කිරි පට්ටි ආශ්‍රිත නිෂ්පාදන, කුකුලු හා මස් නිෂ්පාදන, සහල්, පොල් තෙල් හා පොල් පැණි ඇතුලත් ය. ගවුඩා චීස් සහ කිරි ටොපි ද මේ අතරට ඇතුලත් ය. මීට අමතරව අනෙකුත් නිෂ්පාදකයන්ගේ ජනප්‍රිය නිෂ්පාදන ද පාරිභෝගිකයන්ගේ පහසුව සඳහා අප විකුණුම්හල් වෙතින් ලබා ගැනීමේ පහසුකම් සපයා දී ඇත.

## නැවුම් කිරි භාවිතය ප්‍රචලිත කිරීම

සමාලෝචනයට බඳුන් වූ කාලය තුළ මණ්ඩලය විසින් නැවුම් කිරි භාවිතය ප්‍රචලිත කිරීම සඳහා ගෙන ගිය වැඩ පිළිවෙල දිරි ගන්වන සුළු ප්‍රතිඵල පෙන්වා ඇත. පාරිභෝගිකයන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නිෂ්පාදිත, තත්ත්වය සහතික කළ ගුණාත්මක නැවුම් කිරි නිෂ්පාදන භාවිතයට දැඩි කැමැත්තක් දක්වා ඇත. 'Delite' නමින් නිෂ්පාදිත ටෙට්‍රා පැකට්ටුව අප වෙත නව වෙළඳපොලක් ලබා දී ඇති අතර එය විශේෂයෙන්ම නවීනත්වය අගය කරන්නා වූ පාරිභෝගිකයන්ගේ අගැයීමට ලක්විය.

නැවුම් කිරි භාවිතය ප්‍රචලිත කිරීමේ ප්‍රවර්ධන වැඩසටහනේ කොටසක් ලෙස කොළඹ සහ අවට ප්‍රදේශ වල අලෙවිසල් 60 ක ජාලයක් පිහිටුවා ඇති අතර එවා විශාල ආයතන ප්‍රමාණයක් ආවරණය කරයි. එම ආයතන අතර රාජ්‍ය මෙන්ම සංස්ථා කාර්යාලයන් ද පාසල් සහ විශ්ව විද්‍යාල ද රජයේ රෝහල් ද මහජනතාව එක් රැස් වන වෙළඳසල් හා දුම්රියපොලවල් වැනි ස්ථාන ද ඇතුලත් ය. ඈත පළාත් වල ද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ බොහෝ ගොවිපලවල් විසින් මෙම සේවා සපයයි.











## ප්‍රජා සම්බන්ධතා

සමාලෝචනයට බඳුන් වූ කාලය තුළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මහජනයා සමග සුහද සබඳතාවයක් පවත්වා ගත් අතර විශේෂයෙන්ම ගොවිපල පිහිටා ඇති ප්‍රදේශ වල මෙය ප්‍රශස්ත විය.

මණ්ඩලය සිය මහජන සම්බන්ධතා වැඩසටහනේ කොටසක් ලෙස මහජනයාට සිය කාර්යයන් පිළිබඳව අධ්‍යනය කළ හැකි පරිදි ප්‍රදර්ශන සංවිධානය කිරීම හා රජයේ ප්‍රදර්ශන වලට සහභාගී වීම සිදු කරයි. මණ්ඩලය වසරක් පාසා රටේ විවිධ ප්‍රදේශ වල පවත්වනු ලබන ‘දැයට කිරුළ’ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සහභාගී වෙයි.

ග්‍රාමීය පවුල් වල ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් සිදු කරනු ලබන රජයේ දිවි නැගුම වැඩසටහනේ සක්‍රිය දායකයෙකු ලෙස ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සිය සහයෝගය ලබා දෙයි. මණ්ඩලය වත්තු වගාව ස්ථාපනය සඳහා උදවි සපයූ අතර ඊට පළතුරු, එළවළු, කුකුලු පාලනය සහ පශු සම්පත ද ඇතුලත් විය.

සාමුහිකත්වයේ බලපෑම පිළිබඳව දැනුවත් කිරීම සඳහා ආදර්ශ සංගෘහිත ගොවිපලක් ප්‍රදර්ශන භූමිය තුළ නිර්මාණය කරන ලදි. මීට අමතරව විවිධ බෝග වගාවන් හා කිරි පට්ටි පාලනය පිළිබඳව ද ප්‍රදර්ශනය වූ අතර ප්‍රකෘති ගොවි පවුලක ජීවන රටාව ගැමි ගෙදර හරහා විදහා දක්වන ලදි.

පශු සම්පත් හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යංශය විසින් සංවිධානය කළ අන්තර්ජාතික පශු සම්පත් හා කුකුලුපාලනය පිළිබඳ ප්‍රදර්ශනය 2011 ජූලි මාසයේදී පැවති අතර එයට විශාල ජනකායකගේ ආකර්ශනීය ප්‍රතිචාර හිමි විය. එම ජනතාවට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් සිදු කරන මෙහෙයුම් පිළිබඳව අත්දැකීමෙන්ම දැනුම ලබා ගත හැකි විය.

එහිදී අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විශේෂ උනන්දුවක් දක්වමින් මණ්ඩලයේ කාර්යයන් විශේෂයෙන් අධ්‍යයනය කළේ ය. ආර්ථික හා සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ අවධානයට ද මෙය යොමු වූ අතර ‘ගැමි ගෙදර’ දී පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍ය ආරුමුගම් තොන්ඩමන් සමග තේ කෝප්පයක් රස විඳීමට පවා එක් විය.




Parliamentary Series No. 119
Of
The Seventh Parliament of
The Democratic Socialist Republic of Sri Lanka
(First Session)

First Report

From
The Committee on Public Enterprises

Presented by
Hon. DEW. Gunasekara
Chairman of the Committee
On 01st of December, 2011

REPORT FROM THE COMMITTEE ON PUBLIC ENTERPRISES OF THE PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

6. The Committee appreciated the high standards maintained by the new Management, although there had been lapses in the past.

Accolades









## ඇගයුම්

රාජ්‍ය ව්‍යවසායයන් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව (COPE) විසින් 2011 දෙසැම්බර් පලමු වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ වාර්තාව මගින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කලමනාකරණය කමිටුවේ සිය පැසසුමට ලක්කෙළේය.

කමිටුව විසින්, අතීත අපගමනයන් තිබීය දී වුව ද නව කලමනාකරණය පවත්වාගෙන යනු ලබන ඉහල ප්‍රමිතිය අගය කරන ලදී," යයි පාර්ලිමේන්තු කාරක සභා වර්තාවේ දක්වා ඇත.

2010 මැයි මස 10 වෙනි දින සිට නව අධ්‍යක්ෂ මණ්ඩලය පත් වීමත් සමග ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කලමනාකරණය වෙනස් වීම් ගණනාවකට බඳුන් විය.

## 2011 ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන උළෙලෙහි දී ලැබූ සම්මානය

ජාතික වාණිජ මණ්ඩලය සංවිධානය කළ 2011 ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන උළෙලෙහි දී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මත්ස්‍ය සහ පශු සම්පත් අංශය යටතේ කුසලතා සම්මානයකින් පුද ලැබිණි.
සභාපති රංජිත් ඇල්ලෙගල මහතා විසින් උත්සවයේදී සම්මානය පිළිගන්නා ලදී

## නිවාඩු නිකේතන

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව නිවාඩු නිකේතන හයක් තිබෙන අතර සිය අවිවේකී නාගරික ජීවිතයෙන් මිදී විවේකීව නිවාඩුවක් ගත කිරීමට කැමති සංචාරකයින් සඳහා මේවා ඉතාමත් හොඳින් පවත්වාගෙන යනු ලැබේ. ඒවායින් බොහොමයක් මෑතකදී නවීකරණය කර තිබේ.

නිවාඩු නිකේතන මණ්ඩලයේ ගොවිපල වලට අනුබද්ධ කොට ඇති අතර සාමාන්‍ය නිවාඩු ගත කරන්නා වූ ස්ථාන වලින් වෙනස් වූ ගමනාන්තයන්හි පිහිටුවා ඇත. උදාහරණයක් ලෙස බොහෝ දෙනෙකු විවේකය ගත කිරීමට බලාපොරොත්තු නොවන ස්ථාන වන නිකවැරටිය නිකේතනය හෝ උඩුබද්දාවේ පිහිටි ගල්පොකුණ නිකේතනය පෙන්වා දිය හැකිය. පොලොන්නරුවේ පිහිටි නෙළුම් වැව නිකේතනය තවත් එකකි. අනෙක් නිකේතන ද්විත්වය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ දිගන හා බෝපතලාව ගොවිපල වල, එනම් උඩරට කලාපයේ පිහිටුවා ඇත.

එක් එක් නිකේතනයක නවාතැන් ගත හැකි පුද්ගල සංඛ්‍යාව හතරේ සිට දහ හතර දක්වා අතර විහිදෙයි







## කාර්ය මණ්ඩලයේ සුභසාධනය

ජාතික පශු සම්පත් මණ්ඩලය 2000 පමණ වූ කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. මණ්ඩලය සතු රටේ විවිධ ප්‍රදේශ වල පිහිටුවා තිබෙන ගොවිපල වල ඔවුන් සේවයේ යෙදෙයි.

මණ්ඩලයේ කලමනාකරණය කලින් කලට කාර්යය තත්ත්වය හා කාර්ය මණ්ඩලය වෙත ලබා දුන් පහසුකම් පරික්ෂා කර අවශ්‍ය අයුරු සංශෝධන කරයි. සමාලෝචනයට බඳුන් වූ කාලය ඇතුළතදී කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන වෛද්‍ය දීමනා වැඩි කර තිබේ. වෛද්‍ය ආවරණය රුපියල් 10,000ක් දක්වා වැඩි කරන අතර බාහිර අනතුරු සඳහා ලබා දෙන වෛද්‍ය දීමනා රුපියල් 3,500 දක්වා වැඩි කෙරුණි.

සේවකයන්ගේ නිවාස අවශ්‍යතා නිරන්තරයෙන්ම සොයා බැලෙයි. වැලිසර ගොවිපල තුල කාර්ය මණ්ඩල සඳහා නිල නිවාස පහක් ගොඩ නගා ඇති අතර ලයින් කාමර අළුත්වැඩියා කොට ඇත.

මණ්ඩලය සේවකයන්ගේ දරු දැරියන්ගේ අධ්‍යාපනය සම්බන්ධව සිය විශේෂ අවධානය යොමු කරයි. දිරිගැන්වීම් ලෙස ඔවුන් වෙත අවශ්‍ය පොත් පත් ප්‍රදානය කරන ලදි. මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන ආගමික උත්සව සඳහා සේවකයෝ සහභාගී වෙති. ප්‍රධාන කාර්යාලයේදී පිරිත් පින්කමක් සිදු කළ අතර වෙසක් උළෙලේදී සිදු කරන භක්ති ගීත සන්දර්ශනය වසරක් පාසා පැවැත්වේ. ජාතික උත්සව අවස්ථා වලදී පවුල් එකතුවී විනෝදවීමට අවස්ථා සලසා දෙනු ලැබේ.

කාර්ය මණ්ඩලය ක්‍රීඩා කටයුතු සඳහා ද උනන්දු කරවන අතර වොලිබෝල් ඔවුන් අතර ඉතාමත් ජනප්‍රිය ක්‍රීඩාවකි. 2011 වසරේදී ප්‍රථම වරට සංවිධානය කරන ලද අන්තර් ගොවිපල වොලිබෝල් තරගාවලියේදී ඔවුන් විසින් දැඩි උනන්දුවක් දක්වන ලදි. තියුණු තරගයක් පැවති අතර ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අනුස්මරණ ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පැවති අවසන් තරගය විශාල පිරිසකගේ ආකර්ශනය දිනා ගත් අවස්ථාවක් විය.





# පස් වසරක ප්‍රගතිය

## පශු සම්පත් හා භෝග නිෂ්පාදනය

| ක්‍රියාකාරකම් | ඒකක | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|
| **පශු සම්පත් ප්‍රමාණය** | | | | | | |
| එළ ගවයින් | ඒකක | 8,272 | 8,199 | 8,621 | 8,329 | 8,068 |
| මී ගවයින් | ඒකක | 2,114 | 2,130 | 2,191 | 2,409 | 2,534 |
| **එකතුව** | **ඒකක** | **10,386** | **10,329** | **10,812** | **10,738** | **10,602** |
| එළුවන් | ඒකක | 1,738 | 1,673 | 1,656 | 1,454 | 945 |
| බැටළුවන් | ඒකක | 2,222 | 2,692 | 2,956 | 3,043 | 3411 |
| අභිජනන ඌරන් | ඒකක | 1,306 | 923 | 1,514 | 975 | 1439 |
| **කුකුළන්** | | | | | | |
| බ්‍රොයිලර් මව් සතුන් | ඒකක | 26,743 | 29,904 | 29,953 | 33,838 | 32,878 |
| ලේයර් මව් සතුන් | ඒකක | 6.053 | 5,767 | 4,998 | 9,870 | 7,260 |
| වානිජ ලේයර් | ඒකක | 21,001 | 15,145 | 6,180 | 4,298 | 7,541 |
| වානිජ බ්‍රොයිලර් | ඒකක | 14,979 | 3,336 | 1,433 | 1,958 | 5,400 |
| වටුවන් | ඒකක | 8,349 | 6,552 | 46 | 377 | 252 |
| හාවුන් | ඒකක | 1,117 | 811 | 507 | 0 | 0 |
| **අභිජනන සඳහා පශු සම්පත් නිකුත් කිරීම** | | | | | | |
| එළ ගවයින් | ඒකක | 1,153 | 1,200 | 1,033 | 944 | 1,328 |
| මී ගවයින් | ඒකක | 265 | 174 | 128 | 210 | 185 |
| එළුවන් | ඒකක | 267 | 281 | 274 | 218 | 503 |
| බැටළුවන් | ඒකක | 194 | 367 | 312 | 123 | 181 |
| ඌරන් | ඒකක | 1,516 | 2,294 | 1,833 | 3,328 | 2885 |
| හාවුන් | ඒකක | 1,403 | 1,071 | 746 | 0 | 0 |
| **කුකුලු පැටව් නිෂ්පාදනය** | | | | | | |
| බ්‍රොයිලර් (මිලියන) | ඒකක | 2.08 | 2.3 | 1.8 | 1.8 | 2.3 |
| ලේයර් (මිලියන) | ඒකක | 0.81 | 0.9 | 0.6 | 1.0 | 1.1 |
| **කිරි නිෂ්පාදනය** | | | | | | |
| එළ ගවයින් | ලී-මිලි | 2.9 | 3.2 | 3.3 | 3.2 | 2.8 |
| මී ගවයින් | ලී-මිලි | 0.65 | 0.68 | 0.64 | 0.68 | 0.63 |
| එළු කිරි | ලී | 22,637 | 23.077 | 27,640 | 13,358 | 10,753 |
| **බිත්තර නිෂ්පාදනය (මිලියන)** | ඒකක | 4.1 | 3.4 | 1.9 | 1.0 | 2.0 |
| වටු බිත්තර නිෂ්. (මිලියන) | ඒකක | 0.25 | 0.21 | 0.05 | 0.02 | 0.04 |
| බ්‍රොයිලර් නිෂ්. (පක්ෂීන්) | මිලියන | 0.09 | 0.09 | 0.01 | 0.01 | 0.03 |
| **පොල් නිෂ්පාදනය** | | | | | | |
| නිෂ්පාදිත ගෙඩි ගණන | මිලියන | 21.73 | 20.55 | 21.48 | 20.60 | 19.94 |
| නිෂ්පාදිත කොප්පරා ප්‍රමාණය | මෙ. ටො | 537.4 | 278.7 | 336.71 | 247.85 | 227.18 |

# පශු සම්පත් හා භෝග නිෂ්පාදනය 2010 -2011

| ක්‍රියාකාරකම් | මිම්ම | ප්‍රමාණය | ප්‍රමාණය |
|---|---|---|---|
| **එළ ගවයින්** | | 2010 | 2011 |
| මුළු ප්‍රමාණය | ඒකක | 8,329 | 8,068 |
| වසර 2කට වැඩි වැස්සියන් | ඒකක | 1,550 | 1,318 |
| වසර 0-2 අතර වැස්සියන් | ඒකක | 2,084 | 1,987 |
| වසරට වඩා වැඩි වස්සන් ගණන | ඒකක | 957 | 1,102 |
| සම්පූර්ණ උපත් | ඒකක | 2,613 | 2,380 |
| අභිජනනය සඳහා සම්පූර්ණ නිකුත් කිරීම | ඒකක | 944 | 1,328 |
| රැලට නුසුදුසු ලෙස ඉවත් කිරීම | ඒකක | 932 | 349 |
| සම්පූර්ණ මරණ | ඒකක | 631 | 980 |
| සම්පූර්ණ එළදෙනුන් ගණන | ඒකක | 3,430 | 3,443 |
| කිරි දෙවන එළදෙනුන් ගණන | ඒකක | 1,519 | 1,404 |
| කිරි දෙවන එළදෙනුන් ප්‍රතිශතය | % | 57 | 53 |
| දෙනකගේ දිනක සාමාන්‍ය කිරි නිෂ්පාදනය | ලීටර | 5.8 | 5.6 |
| කිරි මුරයේ සාමාන්‍ය කාලය | දින | 265 | 274 |
| කිරි නිෂ්පාදනය | ලී මිලියන | 3.2 | 2.8 |
| පළමු පැටවා බිහි කරන සාමාන්‍ය වයස | මාස | 34 | 41 |
| පැටවුන් බිහි කරන සාමාන්‍ය පරතරය | දින | 363 | 425 |
| කෘතිම සිංචනය කළ සතුන් ගණන | ඒකක | 3,471 | 3,064 |
| **මී ගවයින්** | | | |
| මුළු ප්‍රමාණය | ඒකක | 2,409 | 2,534 |
| වසර 2කට වැඩි වැස්සියන් | ඒකක | 611 | 527 |
| වසර 0-2 අතර වැස්සියන් | ඒකක | 481 | 489 |
| වස්සන් ගණන | ඒකක | 202 | 422 |
| සම්පූර්ණ උපත් | ඒකක | 642 | 576 |
| අභිජනනය සඳහා සම්පූර්ණ නිකුත් කිරීම | ඒකක | 211 | 185 |
| රැලට නුසුදුසු ලෙස ඉවත් කිරීම | ඒකක | 219 | 9 |
| සම්පූර්ණ මරණ | ඒකක | 207 | 380 |
| සම්පූර්ණ එළදෙනුන් ගණන | ඒකක | 925 | 939 |
| කිරි දෙවන එළදෙනුන් ගණන | ඒකක | 442 | 394 |
| කිරි දෙවන එළදෙනුන් ප්‍රතිශතය | % | 45 | 49 |
| දෙනකගේ දිනක සාමාන්‍ය කිරි නිෂ්පාදනය | ලීටර | 6.0 | 4 |
| කිරි මුරයේ සාමාන්‍ය කාලය | දින | 254 | 281 |
| කිරි නිෂ්පාදනය | ලී මිලියන | 0.68 | 0.63 |
| පළමු පැටවා බිහි කරන සාමාන්‍ය වයස | මාස | 52 | 58 |
| පැටවුන් බිහි කරන සාමාන්‍ය පරතරය | දින | 511 | 432 |
| කෘතිම සිංචනය කළ සතුන් ගණන | ඒකක | 45 | 51 |

| ක්‍රියාකාරකම් | මිම්ම | ඒකක | ඒකක |
|---|---|---|---|
| **කුකුළන්**<br>**බ්‍රොයිලර් මව් සතුන්** | ඒකක | 2010 | 2011 |
| මුළු එකතුව | ඒකක | 33,838 | 32,878 |
| ආනයනය කරන ලද සතුන් | ඒකක | | |
| පිරිමි | ඒකක | 7,609 | 1 889 |
| ගැහැණු | ඒකක | 19,116 | 12,810 |
| මුළු බිත්තර නිෂ්පාදනය | ඒකක | 2,496,626 | 3,574,459 |
| රැකිය හැකි බිත්තර නිෂ්පාදනය | ඒකක | 2,332,740 | 4,284,521 |
| පැටවුන් බිහිකිරීමේ ප්‍රතිශතය | % | 76 | 78 |
| නිෂ්පාදිත කුකුළු පැටවුන් ගණන | ඒකක | 1,768,333 | 2,329,205 |
| ලේයර් මව් සතුන් | | | |
| මුළු එකතුව | ඒකක | 9,870 | 7,260 |
| ආනයනය කරන ලද සතුන් | | | |
| පිරිමි | ඒකක | 1,380 | 1,798 |
| ගැහැණු | ඒකක | 11,492 | 14,103 |
| මුළු බිත්තර නිෂ්පාදනය | ඒකක | 1,575,334 | 1,919,251 |
| රැකිය හැකි බිත්තර නිෂ්පාදනය | ඒකක | 1,417,274 | 1,755,556 |
| පැටවුන් බිහි කිරීමේ ප්‍රතිශතය | % | 75 | 75 |
| නිෂ්පාදිත කුකුළු පැටවුන් ගණන | ඒකක | 956,338 | 1,141,007 |
| **වානිජ බ්‍රොයිලර් නිෂ්පාදනය** | | | |
| මුළු එකතුව | ඒකක | 1,958 | 5,400 |
| **බ්‍රොයිලර් නිෂ්පාදනය** | සතුන් | 7,114 | 37,161 |
| **වානිජ බිත්තර නිෂ්පාදනය** | | | |
| මුළු එකතුව | ඒකක | 4,298 | 7,541 |
| මුළු කිකිළියන් එකතුව | ඒකක | 6,466 | 7,944 |
| බිත්තර නිෂ්පාදනය | ඒකක මිලි | 1,042,385 | 2,095,328 |
| **අභිජනන ඌරන් ඇතිකිරීමේ කාර්යය සාධනය** | | | |
| මුළු එකතුව | ඒකක | 975 | 1,439 |
| ඉපදුනු ඌරු පැටවුන් ගණන | ඒකක | 3,228 | 3,571 |
| වරකට බිහි කරන ගණන (ඊරියකගෙන්) | ඒකක | 9 | 8 |
| වරකට බිහි කරන ගණන (නෑම්බියකගෙන්) | ඒකක | 8 | 8 |
| මැරුණු ඌරු පැටව් ගණන | ඒකක | 294 | 313 |
| **එළුවන් ඇති කිරීමේ කාර්යය සාධනය** | | | |
| මුළු එකතුව | ඒකක | 1,454 | 945 |
| ඉපදුනු පැටවුන් ගණන | ඒකක | 642 | 374 |
| පැටවුන් දැමීමේ වාර ගණන | ඒකක | 0.78 | 0.61 |
| මැරුණු ගණන (වැඩිහිටි හා පැටවුන්) | ඒකක | 191 | 355 |
| අභිජනනය සඳහා නිකුත් කිරීම | ඒකක | 218 | 503 |
| **බැටළුවන් ඇති කිරීමේ කාර්යය සාධනය** | | | |
| මුළු එකතුව | ඒකක | 3,043 | 3,411 |
| ඉපදුනු පැටවුන් ගණන | ඒකක | 1,434 | 1,294 |
| පැටවුන් දැමීමේ වාර ගණන | ඒකක | 0.75 | 0.76 |
| මැරුණු ගණන (වැඩිහිටි හා පැටවුන්) | ඒකක | 188 | 323 |
| අභිජනනය සඳහා නිකුත් කිරීම | ඒකක | 123 | 181 |

# මූල්‍ය ප්‍රකාශන
# 2011

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

ඒඑෆ්/ඩී/එන්එල්ඩීබී/එෆ්ඒ/2011 — 2012 ඔක්තෝබර් 16 දින

සභාපති,
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

**පාතික පශු සංවර්ධන මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදයම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ 25 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2012 මැයි 30 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණක ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් කත්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණක පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදගන්නා ලද ගිණම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණක සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

රු.62,931,670 ක්වූ නැවුම් කිරි අලෙවිසැල් ක්ෂය කිරීම සඳහා පෙර වර්ෂයේ යොදගත් ක්ෂය අනුපාතය 20% සිට 25% දක්වා වැඩිකර ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණද ඒ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ බඩඉරිඟු වගාවට ගොවිපල සකස් කිරීම සඳහා දරා තිබුණු රු.5 ,449,714 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තුව වූ රු.2,081,750 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණු අතර 2011 වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තුව වූ රු. 2,081,750 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණු අතර 2011 වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රු 12,444,661 ක්වූ සමුච්චිත තොග ඌනතාවයද ඇතුලත්ව අවසන් තොග ප්‍රපාත් අගය ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ශුද්ධ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) නිකවැරටිය ගොවිපලින් දැදුරු ඔය වාරිමාර්ග ව්‍යාපෘතියට පවරා දුන් අක්කර 120 ක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනවලින් ඉවත්කර නොතිබුණි.

### 2.2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බඩඉරිඟු ව්‍යාපෘතියට අදලව 2009 වර්ෂයේ සිට පැවත එන රු 2,300,598 ක අයවිය යුතු මුදල ගොවීන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේදී හම්බන්තොට ප්‍රදේශයේ ගොවීන් වෙත ණය පදනම මත රු.1,070,435 ක්වූ කුකුළු පැටවුන් මාරවිල ගොවිපල විසින් ලබාදී තිබුණද 2012 සැප්තැම්බර් 30 දින වන විටද එම මුදල් අයකර ගෙන නොතිබුණි.

(ඇ) කරඳගොල්ල හා මිරිස්වත්ත ගොවිපලවල්හි පැවති වර්ෂ 05 ඉක්මවූ ණයගැතියන් පිළිවෙලින් රු.243,718 ක් හා රු 240 000 ක්වූ අතර එම මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබණි.

(ඈ) වීරවිල ගොවිපලෙහි වසර දෙකකට වඩා පැරණි සේවක වෙළඳ ණයගැති ශේෂය රු.255,442 ක් හා වෙළඳ ණයගැති ශේෂය රු.300,626 ක් අයකර ගෙන නොතිබුණි.

(ඉ) රිදියගම ගොවිපලෙහි වසර තුනකට වඩා පැරණි සේවක වෙළඳ ණයගැති ශේෂය රු.101,907 ක් හා වසර 2 ඉක්මවූ වෙළඳ ණයගැති ශේෂය රු.392,196 ක් අයකර ගෙන නොතිබුණි.

(ඊ) අවුරුදු 01කට වඩා පැරණි රු.43,232,632 ක් වටිනා ණයගැතියන්ගෙන් රු.17,768,762 ක් පමණක් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ රිදියගම ගොවිපල වෙත බඩඉරිඟු ලබා නොදුන් ගොවීන් තිදෙනෙකුගෙන් රු.221,038 ක් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාර පියවර ගෙන නොතිබුණි.

(ඌ) 1992 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලඟා ගෙන තිබුණු රු.50,000,000 පොලී රහිත ණය මුදල සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි .

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| ලංකා බැංකුව - කන්තලේ | 598, 309 | (i) බැංකු සැසඳුම් වාර්තා<br>(ii) ශේෂ සනාථ කිරීම් |
| මහජන බැංකුව - කන්තලේ | 13,721 | |
| මහජන බැංකුව - ප්‍රධාන කාර්යාලය | 249,064 | |
| කෙරීගෙන යන වැඩ | 25,848,048 | ඉංජිනේරුවරයකුගේ සහතික සහිත විස්තරාත්මක උපලේඛන |
| ණයහිමියෝ | 210,527,092 | ණයහිමි උපලේඛනය |
| දියර කිරි ව්‍යාපෘතියේ තොග ගිණුම් බැර ශේෂය | 90,182 | (i) බැර ශේෂයන් ඇති වීමට හේතු<br>(ii) විස්තරාත්මක උපලේඛන |
| දියර කිරි ව්‍යාෘතියේ මුදල් ඌනතාවය | 34,430 | ඌනතාවය පිළිබඳ පරීක්ෂණ වාර්තා |
| ජ නල් සටහන් | | අදල සංලක්ෂයන් |
| අයකරගත යුතු අර්ථසාදක දඩ මුදල් | 93,543 | වගකීම් පැවරී ඇති පුද්ගලයන් පිළිබඳ විස්තර |
| ඩෝසරය සඳහා බාහිර පාර්ශවයන් සැපයූ ඉන්ධන | 284 ,699 | ඉන්ධන බිල්පත් |

**2.2.5 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත<br>(i) 10(5) වගන්තිය | 248,688,654 | ශුද්ධ අතිරික්ත ආදායමෙන් ඉතිරි සියළු මුදල් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ උපයා තිබූ ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |
| | (ii)16(2)(අ) හා (ආ) වගන්ති | 21,812,323 | බැංකු අයිරා පහසුකම් ලැබීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ හා අදාල අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මු.රෙ.165 | 14,607 | ලැබුනා වූ මුදල් ස්වකීය මුදල් පොතෙහි සටහන් කල යුතු වුවත් වීරවිල ගොවිපල විසින් උපයා තිබූ මුදල්,මුදල් පොතෙහි සටහන් කර නොතිබුණි. |
| | (ii) මු.රෙ.187(1) | 19,794 | ලැබෙන සියලු මුදල් සුරක්ෂිතාගාරයක තැන්පත් කල යුතු වුවද වීරවිල ගොවිපල විසින් එසේ තැන්පත් කර නොතිබුණි. |
| (ඇ) | 2011 මැයි මස 26 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක: 11/0927/511/004-1 | 3,831,431 | පශුසම්පත් හා කුකුළු පාලනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රදර්ශනය සඳහා රජයේ අරමුදල් උපයෝගී කර නොගන්නා ලෙස දන්වා තිබුණ ද එකී නියෝගයට පටහැනිව ප්‍රදර්ශනය සඳහා මණ්ඩලය විසින් මුදල් වැයකර තිබුණි. |
| (ඈ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | |
| | 6.5.1 ඡේදය | - | කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. |
| | 8.3.8 ඡේදය | 1,505,803 | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව කිරි ව්‍යාපෘතියෙන් හා ප්‍රධාන කාර්යාලයෙන් පරිත්‍යාග සිදුකර තිබුණි. |
| | 8.3.9 ඡේදය | 3,827,906 | රේබීය අමාත්‍යංශයේ හෝ වෙනත් රාජ්‍ය ආයතනයක වියදම් නොදැරිය යුතු යයි නියම කර තිබුණද රේබීය අමාත්‍යාංශයේ හා වෙනත් රාජ්‍ය ආයතන 03 ක වියදම් මණ්ඩලය විසින් දරා තිබුණි. |
| (ඉ) | 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ඡේදය | | වාහන කුලියට ගැනීමේ දී මාසික කුලිය රු 40,000 නොඉක්මවිය යුතු වුවද ඊට පටහැනිව රු 48,000 කට කුලී වාහනයක් ලබාගෙන තිබුණි. |
| (ඊ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 ඡේදය | 400,000 | රිදියගම ගොවිපල විසින් මිල කැඳවීමකින් තොරව විවිධ මිල ගණන් යටතේ මී කිරි මුදවීම සඳහා මැටි හට්ටි 48,040 ක් ලබාගෙන තිබුණි. |
| | | 81,000 | ලියාපදිංචි පවිත්‍රතා සේවා සපයන ආයතන විසින් ඉදිරිපත්කර තිබූ රු 72,000 ක අවම මිලට කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබූ අතර මිල ගණන් ඉදිරිපත් නොකල කොන්ත්‍රාත්කරුවෙකු වෙත මාසයකට රු 81,000 ක් ගෙවා එම සේවාව ලබා ගෙන තිබුණි. |
| (උ) | 2011 අගෝස්තු 12 දිනැති අංක 34/2011 දරන කාර්යාල චක්‍රලේඛයේ 2 ඡේදය | 30,000 | මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනයට පටහැනිව රිදියගම ගොවිපලෙහි ලොරි රථයෙන් අලෙවි කල ගවයන් ප්‍රවාහනය කර තිබුණ අතර ප්‍රවාහනය කිරීමට අවශ්‍ය බලපත්‍රය දෝෂ සහිත වීම නිසා ඊට එරෙහිව පොලීසිය විසින් නඩු පැවරීම හේතුවෙන් නීති ගාස්තු ලෙස මෙම මුදල ගෙවීමට සිදුවී තිබුණි. |

**2.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඇමරිකාවේ පැවැත්වූ පශු සම්පත් ප්‍රදර්ශනයට අමාත්‍යාංශ නිලධාරීන් දෙදෙනෙකු සහභාගි කරවීමට රු. 647,810 ක වියදම් මණ්ඩලය දරා තිබුණි.

(ආ) උපදේශකයින් පත් කිරීමට හා දීමනා ගෙවමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන උපදේශකවරුන් 10 දෙනෙකු සඳහා මණ්ඩලය විසින් 2011 වර්ෂයේදී රු.1,815,422 ක් ගෙවා තිබුණි.

**2.2.7 අරමුණුවලට පටහැනි ගෙවීම්**

මණ්ඩලයේ අරමුණු වලට පටහැනිව ක්‍රීඩා උත්සව අවුරුදු උත්සව හා ආගමික උත්සව සඳහා රු.3,203,955 ක් වැය කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1.මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵපය රු. 248,688,654 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.176,463,447 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.72,225,207 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ආදයම හා වෙනත් මෙහෙයුම් ආදයම් රු.142,579,099 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මුළු වරලත් අලෙවි 102 න් අලෙවි සැල් 74ක් ක්‍රියාකාරී තත්ත්වයේ පැවති අතර සමාලෝචිත වර්ෂයේ වරලත් අලෙවි සැල් ව්‍යාපෘතියේ ශුද්ධ අලාභය රු.2,704,222 ක් විය.

(ආ) දියර කිරි ව්‍යාපෘතිය යටතේ ඉදිකල අලෙවි සැල් 128 න් 83 ක් ක්‍රියාකාරී තත්ත්වයේ පැවතුණු අතර 09 ක් ගලවා ඉවත් කර තිබුණි.සමාලෝචිත වර්ෂයේදී අලෙවි සැල් 18 ක් රු. 6,157,815 ක ලාභයක් හා අලෙවි සැල් 56 ක් රු.7,867,863 ක පාඩුවක් ලබා තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රිදියගම ගොවිපලෙන් අක්කර 150 ක් 2001 වර්ෂයේ සිට පුද්ගලයින් 98 දෙනෙකු අනවසර වගා සඳහා අල්ලා ගෙන ඇති අතර ඔවුන් ගොවිපලින් ඉවත්කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් 2009 ඔක්තෝබර් 06 දිනැති ලිපියෙන් දන්වා තිබූ පරිදි මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු රුපියල් මිලියන 10 ක ලාභාංශ සමාලෝචිත වර්ෂයේදී ගෙවා නොතිබුණි.

(ඇ) අවිධිමත් ලෙස උසස්කර තිබූ සහකාර සාමාන්‍යාධිකාර තනතුරු 04 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ජූලි 27 දිනැති ලිපිය මගින් දන්වා තිබූ පරිදි විධිමත් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ඈ) 2009 වර්ෂයේ සිදු වී තිබූ ප්‍රධාන කාර්යාල අලෙවිසැලේ රු.900,000 ක භාණ්ඩ හා මුදල් අඩුවීමට වගකිවයුතු පුද්ගලයින්ගෙන් එම වටිනාකම් 2011 වර්ෂයේද අයකරගෙන නොතිබුණි.

(ඉ) කන්තලේ බඩඉරිඟු ව්‍යාපෘතියෙන් ලදුපත් නිකුත් කර තිබූ නමුත් නොලැබුණු රු. 30,250 ක් වගකිවයුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට හා 2008 වර්ෂයේ බීජ බඩඉරිඟු අලෙවියෙන් ලැබූ රු.79,750 ක් අයථා පරිහරණයට අදල නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමට 2011 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) බඩඉරිඟු ව්‍යාපෘතියට අදල රු. 861,094 ක බැංකු ගිණුම් 03 ක් 2010 ජූනි මාසයේ සිට අක්‍රියව පැවතුණි.

(ආ) පොළොන්නරුව ගොවිපලේ ගව ගාල් 03 ක් හා විවිධ කාර්යයන් සඳහා භාවිතා කරන ලද ගොඩනැගිලි 09 ක් දීර්ඝ කාලයක සිට පාවිච්චියට ගෙන නොතිබුණි.

(ඇ) පොළොන්නරුව ගොවිපලේ හා පර්සන්ගස්වැව ගොවිපලේ පරිහරනය නොකර අත්හැර දමා තිබෙන නිවාස 33 ක් සම්බන්ධව නිසි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඈ) භාවිතයට නොගන්නා හා භාවිතා කළ නොහැකි යතුරු පැදි ට්‍රැක්ටර් හා ත්‍රිවීලර් 18 ක් මණ්ඩලය සතුව පැවතුණි.

### 4.4 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

පොළොන්නරුව ගොවිපලේ නෙලුම්වැව සංචාරක නිවාසයේ පඩි 13 ක් සහිත පියගැට පෙලක් නවීකරණය කිරීමට රු.60,000 ක් වියදම් කිරීමෙන් පසු ප්‍රයෝජනයට නොගෙන ගලවා ඉවත් කර තිබුණි.

### 4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පොළොන්නරුව සංචාරක නිවාසය නවීකරණය සඳහා රුපියල් මිලියන 16 ක දල වියදම් ඇස්තමේන්තුවක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි මේ සම්බන්ධයෙන් පහත කරුණු විගණනයේදි නිරීක්ෂණය විය.

(i) සංචාරක නිවාසයේ නවීකරණ කටයුතු සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොමැති බව.

(ii) නවීකරණ කටයුතු ප්‍රසම්පාදන කාර්යයන් 14 ක් ලෙස සලකා කටයුතු කර ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු මගින් අනුමත කරවා ගෙන තිබූ බව.

(iii) උක්ත ප්‍රසම්පාදන කාර්යයන් 14 එකම කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබීම

(iv) ප්‍රසම්පාදන කමිටුව කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා අනුමැතිය දීමට පෙර නවීකරණ කටයුතු ආරම්භකර ඇති බව.

ඉහත කරුණු අනුව මෙම ප්‍රසම්පාදන කාර්යයන් විවෘත තරඟකාරී හා විනිවිදභාවයෙන් යුක්තව සිදුවී ඇතැයි සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) නියමිත ප්‍රසම්පාදන කාර්ය පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව රු.5,279,051 ක වියදමක් දරා ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීම් හා අලුත්වැඩියා සිදුකර තිබුණි.

## 5 ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

### 5.1 සංයුක්ත සැලැස්ම

මණ්ඩලය විසින් 2008 - 2012 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර තිබුණද එය වාර්ෂිකව යාවත්කාලීන කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් වී නොමැති ක්‍රියාකාරකම් 38 ක් ගොවිපොල 19 විසින් සිදුකර තිබුණි.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් ගොවිපලවල් 23 කට අදල ක්‍රියාකාරකම් 38 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාවට නංවා නොතිබුණි.

ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් වූ ගොවිපලවල් 24 කට අදල ක්‍රියාකාරකම් 53 ක ප්‍රගතිය 50% කට වඩා අඩු මට්ටමක පැවතුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

2011 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම් සකස්කර තිබුණද මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් එම සැලසුමේ ඇතුලත් කර නොතිබුණි.

### 5.4 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් අයවැය ලේඛනයක් සකස්කර නොතිබූ බැවින් අයවැය ලේඛනය පාලන උපකරණයක් ලෙස යොදගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

### 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

මණ්ඩලය විසින් 2008 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකරන ලදී.පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඇ) ණයගැතියෝ හා ණයහිමියෝ
(ඈ) මිලදී ගැනීම්
(ඉ) ගොවිපල ඉඩම් පරිපාලනය
(ඊ) මූල්‍ය කළමනාකරණය
(උ) අයවැය පාලනය
(ඌ) ජ්'නල් සටහන්

**එච්.ඒ.එස්.සමරවීර**
විගණකාධිපති

## 2011 වසර සඳහා ඒකාබද්ධ ලාභාලාභ ගිණුම

| | සටහන් | 31.12.2011 දිනෙන් අවසන් වූ වර්ෂය රුපියල් | 31.12.2010 දිනෙන් අවසන් වූ වර්ෂය රුපියල් |
|---|---|---|---|
| ආදයම් | 5 | 1,231,958,718 | 1,099,722,297 |
| විකුණුම් පිරිවැය | | (871,843,346) | (797,818,226) |
| **දළ ලාභය** | | 360,115,372 | 301,904,071 |
| වෙනත් මෙහෙයුම් ආදයම | 6 | 29,968,042 | 19,625,364 |
| | | 390,083,414 | 321,529,435 |
| රජයේ ප්‍රදාන | | 1,187,500 | 5,125,000 |
| | | 391,270,914 | 326,654,435 |
| බෙදාහැරීමේ පිරිවැය | | (4,382,003) | (3,574,785) |
| පරිපාලන වියදම් | | (121,766,384) | (107,912,043) |
| වෙනත් වියදම් | | (1,414,972) | (10,656,712) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ලාභය** | 7 | 263,707,556 | 204,510,895 |
| මූල්‍ය පිරිවැය | | (14,017,242) | (28,695,065) |
| **බදු පෙර ලාභය (අලාභය)** | | 249,690,314 | 175,815,830 |
| වත්කම් විකිණීමෙන් ලත් ලාභය | | 504,845 | 3,129,328 |
| බදු | 8 | (1,506,504) | (2,481,711) |
| **වසර සඳහා වූ ලාභය** | | **248,688,654** | **176,463,447** |

# 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | සටහන් | 2011 දෙසැම්බර් 31 දිනට | 2010 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 10 | 629,040,422 | 499,473,587 |
| වෙනත් වත්කම් | 11 | 589,051,874 | 481,819,391 |
| | | 1,218,092,296 | 981,292,978 |
| උප සමාගම්වල ආයෝජනය | 9 | 15,995,171 | 15,995,171 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | | 197,347,491 | 168,272,292 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | | 178,721,439 | 145,382,142 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | | 46,428,054 | 50,489,106 |
| | | 422,496,984 | 364,143,540 |
| **මුළු වත්කම්** | | **1,656,584,451** | **1,361,431,689** |
| **ස්කන්ධය හා බැරකම්** | | | |
| ප්‍රාග්ධනය හා සංචිතය | | | |
| ප්‍රාග්ධන | | 576,587,649 | 576,587,649 |
| සංචිත | | 167,337,303 | 153,857,557 |
| ලාභාලාභ ගිණුම | | 207,477,126 | (41,211,528) |
| | | 951,402,078 | 689,233,678 |
| චක්‍රිය අරමුදල් | | 37,500,000 | 37,500,000 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දීර්ඝ කාලීන වගකීම් | 12 | 128,174,367 | 117,863,653 |
| විලම්බිත වගකීම් | 14 | 166,434,507 | 166,466,691 |
| මහ භාණ්ඩාගාරයෙන් ලැබුණ ණය | 13 | 50,000,000 | 50,000,000 |
| | | 344,608,874 | 334,330,344 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ණය | 15 | 281,579,647 | 249,065,881 |
| වසරක් තුළ ගෙවිය යුතු දීර්ඝ කාලීන ණය | | 19,681,528 | 17,037,444 |
| බැංකු අයිරාව | | 21,812,323 | 34,264,342 |
| | | 323,073,499 | 300,367,667 |
| මුළු ස්කන්ධය හා බැරකම් | | **1,656,584,451** | **1,361,431,689** |

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන අංක 38 දරණ මුදල් පනතේ අවශ්‍යතා අනුව හා ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිතීන් අනුව පිළියෙල කර ඇති බව මම මෙමගින් සහතික කරමි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂකවරුන් සතුවේ.මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

ගණකාධිකාරී

සභාපති

# ස්කන්ධයෙහි වෙනස්වීම් සම්බන්ධ ප්‍රකාශනය

| 31.12.2011 න් අවසන් වසර සඳහා | ප්‍රාග්ධනය<br>රුපියල් | ප්‍රාග්ධන සංචිත<br>රුපියල් | අයහාර සංචිත<br>රුපියල් | ලාභාලාභ ගිණුම<br>රුපියල් | එකතුව<br>රුපියල් |
|---|---|---|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 576,587,649 | 131,884,428 | 21,973,129 | (41,211,528) | 689,233,678 |
| රජයෙන් ලැබුණු ප්‍රදාන | | 14,667,246 | | | 14,667,246 |
| ක්‍රමක්ෂය - රජයේ ප්‍රදාන | | (1,187,500) | | | (1,187,500) |
| වර්ෂය සඳහා වූ ලාභය | - | | - | 248,688,654 | 248,688,654 |
| 2011 දෙසැම්බර් මස 31 දිනට ශේෂය | 576,587,649 | 145,364,174 | 21,973,129 | 207,477,126 | 951,402,078 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| 31.12.2011 දිනට | 2011 රුපියල් | 2010 රුපියල් |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ලැබූ මුදල් ප්‍රවාහය** | | |
| වසර සඳහා වූ ශුද්ධ ලාභය / (අලාභය) | 248,688,654 | 176,463,447 |
| මුදල් නොවන ගනුදෙනු සඳහා වූ ගැලපීම් | | |
| දේපළ යන්ත්‍ර හා උපකරණ විකිණීම මත ලාභය / (අලාභය) | (504,845) | (3 129 328) |
| ක්ෂය කිරීම් | 32,345,576 | 32,218,289 |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වූ ප්‍රතිපාදන | 16,602,511 | 29,906,056 |
| බොල් ණය සඳහා වූ ප්‍රතිපාදන | 159,934,446 | 13,503,564 |
| පොළී | 14,017,242 | 26,817,840 |
| ප්‍රසාද දීමනා සඳහා වූ ප්‍රතිපාදන | 8,000,00 | 8,206,000 |
| කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්වීමට ප්‍රථම උත්පාදනය වූ මුදල් | 335,142,585 | 283,985,868 |
| **කාරක ප්‍රාග්ධනයෙහි වැඩිවීම / අඩුවීම** | | |
| තොග වල වැඩිවීම (අඩුවීම) | (29,075,199) | (37,489,836) |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ණය වල - වැඩිවීම / (අඩුවීම) | (46,305,085) | (40,281,389) |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ණය වල - වැඩිවීම/(අඩුවීම) | 24,513,766 | 17,378,406 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රමාණය | 284,276,068 | 223,593,049 |
| ගෙවන ලද පොළී | (14,017,242) | (26,817,840) |
| ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂික | (16,634,695) | (17,881,366) |
| ගෙවන ලද බදු | (3,027,659) | (3,008,233) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් උත්පාදනය කළ ශුද්ධ මුදල් ප්‍රමාණය | 250,596,472 | 175,885,609 |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | | |
| දේපළ යන්ත්‍ර හා උපකරණ මිළදී ගැනීම් (ශුද්ධ) | (161,913,147) | (45,608,571) |
| අනෙකුත් වත්කම් මත ආයෝජන | (107,232,483) | (73,085,891) |
| දේපළ යන්ත්‍ර හා උපකරණ විකිණීම මත ලත් මුදල් | 505,580 | 3,361,689 |
| | (18,043,578) | (60,552,836) |
| **මූල්‍ය කරණ ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය** | | |
| රජයේ ආධාර ලැබීම් | 13,479,746 | (715,543) |
| ණයවල ශුද්ධ සංචලනය | 12,954,798 | (17,037,482) |
| මුදල් හා මුදල් වලට සමාන දේ වල වැඩිවීම් / (අඩුවීම්) | 8,390,967 | 42,799,811 |
| වසර මුලදී තිබූ මුදල් හා මුදල් වලට සමාන දේ | 16,224,764 | ( 26,575,047) |
| වසර අවසානයේ දී තිබූ මුදල් හා මුදල් වලට සමාන දේ | 24,615,731 | 16,224,764 |

# මුල්‍ය ප්‍රකාශනවලට සටහන්

31.12.2011 දිනට අවසන් වර්ෂය

1. සංයුක්ත තොරතුරු

1.1 පොදු

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 1973 දි ස්ථාපිත කරන ලද අතර ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන ලද්දේ 1974 දීය. වර්තමානයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පශු සම්පත් හා පොල් වගාව පවත්වා ගෙන යාමට පුහුණු මධ්‍යස්ථානයක් සමග එහි සම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපොල් 30 ක් පාලනය කරයි. මණ්ඩලයේ ලියා පදිංචි කාර්යාලය අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 5 යන ස්ථානයේ පිහිටා ඇත.රටේ පශු සම්පත් දියුණු කිරීමට පශු/භෝග ඒකාබද්ධ ගොවිපල් ක්‍රමය සමග පශු සම්පත් අභිජනන ගොවිපොලවල් පවතවා ගෙන යාම මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වේ.

1.2 උප හා උප සමාගම්

සීමාසහිත ශ්‍රී ලංකා ලිබියා කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන සමාගම නිකුත් කළ ප්‍රාග්ධනයෙන් 51 % ක් මණ්ඩලය විසින් අත්කර ගෙන ඇත. කොළඹ 2, නවම් මාවතේ, අංක 46/56 යන ස්ථානයේ එහි ලියා පදිංචි කාර්යාලය පිහිටා ඇත. කෘෂිකර්ම, පශු සම්පත් හා ලිබියාවට තේ අපනයනය පරීක්ෂාව සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ .

මව් සමාගම වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් සිව් දෙනෙකු මෙම උප සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කොට ඇත . සීමාසහිත ශ්‍රී ලංකා ලිබියා කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන සමාගම අත්පත් කරගැනීමට කැබිනට් මණ්ඩලය තීරණය කොට ඇත .

2. ගිණුම් ප්‍රතිපත්ති

2.1 පොදු ප්‍රතිපත්ති

2.1.1 සකස් කිරීමේ පදනම

2011 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා වූ ශේෂ පත්‍රය, ආදයම් හා වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ, මුල්‍ය ප්‍රකාශය, අදළ සටහන් හා ගිණුම් ප්‍රතිපත්ති මෙයට අමුණා ඇත පිළියෙල කර ඇති ගිණුම් වල ඇතුලත් සියළු කරුණු සැලකිය යුතු සෑම අංශයකින්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ.ඉදිරිපත් කර ඇති මෙම මුල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා රුපියල් වලින් වන අතර එය ඓතිහාසික පිරිවැය මත සකස් කර ඇත .

2.1.2 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම් ප්‍රතිපත්තීන් මණ්ඩලය නිත්‍ය වශයෙන් ම භාවිතා කරන අතර, පෙර වර්ෂ වල යොද ගත් සංසන්දනාත්මක අගයන් මෙම වර්ෂයේ ඉදිරිපත් කිරීමේ රටාවට අනුව නැවත ගැලපීමක් සිදුකර ඇත . ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ වියදමක් ලෙස පෙර වර්ෂ වියදම්, විගණාධිපතිගේ නිර්දේශයන්ට අනුව එම වියදම් සියළු ගොවිපළ ගිණුම් ඒකකයන්ට විභජනය කර ඇත .

2.1.3 අඛණ්ඩභාවය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අඛණ්ඩව පවතින හා වත්කම් ද්‍රවශීල කිරීමට අවශ්‍යතාවයක් ඇති නොවන එමෙන්ම නිවාරය නොවන ආයතනයක් ලෙස සලකා ඇත.

2.1.4 උපචිත පදනම

යම් ගණුදෙනුවක් සිදු වූ විගස එහි ලදුපත් හෝ ලියකියවිලි මුදල් ආදිය ලැබීමක්/ගෙවීමක් සිදුවුණත් නැතත් එය සිදු වූ ගණුදෙනුවක් සේ සැලකීම

2.1.5 විදේශ විනිමය ගණුදෙනු

විදේශ විනිමය හුවමාරු ගණුදෙනු අදාළ ගනුදෙනු සිදු වූ දිනයේ පැවැති විදේශ විනිමය හුවමාරු මිලගණන් අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර වාර්තා වල සටහන් කර ඇත .

2.1.6 විලම්බිත බදුකරණය

විලම්බිත බදු බැඳියාවක් නොමැත . එකතු වූ බදු පාඩු තත්ත්වයක් පවතින බැවින් ශේෂ පත්‍ර දිනට විලම්බිත බදු බැඳියාවක් නොමැත .

2.1.7 වැට් බද්ද

මණ්ඩලය වැට් බදු සඳහා අදාළ වන අතර මෙම වැට් පනතේ නීතිමය විධිවිධානයන්ට අනුව කටයුතු කර ඇත .

2.1.8 ආර්ථික හා සේවා ගාස්තු

මෙම ආර්ථික හා සේවා ගාස්තු වලට අදාළ අයභාර ආදායම් සඳහා ESC ගෙවිය යුතු අතර මණ්ඩලය සියළු ESC බදු ගෙවා ඇත .

2.1.9 විලම්බිත අයභාර වියදම්

(අ) පොල් ව්‍යාපෘති

පොල් නැවත වගාව සහ යටි වගාව සඳහා වූ වියදම් සිටවීම හා නෙලන කාලය ලෙස ගැනෙන වර්ෂ 07 ක කාලය තුළ ප්‍රාග්ධනික වියදමක් ලෙස සලකනු ලැබේ. වාණිජමය ඵල නෙලීම ආරම්භයේ සිට වසර 35 ක කාලය තුළ මෙම වියදම් ලියා හරිනු ලැබේ.

(ආ) තෘණ සංවර්ධනය

තෘණ වගා වියදම් තෘණ සිටුවීමේ සිට කපන කාලය වූ මාස 05 දක්වා ප්‍රාග්ධනික වියදමක් ලෙස සලකනු ලැබේ. එය වසර 05 ක කාලය තුළ හිලව් කරනු ලැබේ.

2.2 වත්කම් තක්සේරු කිරීම හා එහි මිනුම් ක්‍රම

2.2.1 තොග

බිල් පැන ගිය හා හෙමින් අලෙවි වන භාණ්ඩ වෙනුවෙන් නියමිත වෙන්කිරීම් කිරීමෙන් පසු භාණ්ඩවල පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු ප්‍රමාණයට තක්සේරු කර ඇත.සාමාන්‍ය වෙළඳාමේ දී භාණ්ඩ විකිණීමට හැකි මුදලින් විකිණීම සම්පූර්ණ කිරීම සඳහා යන වියදම් අඩු කිරීමෙන් ශුද්ධ උප ලබ්ධි අගය ගණනය කර ඇත .

(i) සතුන් ( කුකුළන් හැර)
උදා: ගවයින් මීහරක් යනා දී

පහත සඳහන් කරුණු පදනම් කරගෙන අභිජනනය සඳහා වූ සතුන් මණ්ඩලීය චක්‍රලේඛ අනුව ප්‍රමිති මිල ගණන් යටතේ තක්සේරු කොට ඇත .

1 ජීව බර
2 කිරි මුර ප්‍රමාණය
3 කිරි නිෂ්පාදනය
4 ගැබ්බර බර
5 ප්‍රවේණි / ජාන අගය

අනෙක් සතුන්

ජීව බර ප්‍රවේණි / ජාන අගය හා ගැබ්බර බව පදනම් කරගෙන බැටළුවන් එළුවන් ඌරන් හා හාවුන් ප්‍රමිති මිල ගණන් යටතේ තක්සේරු කොට ඇත .

සියළුම රැලට නුසුදුසු සතුන් බර පදනම් කරගෙන ප්‍රමිති මිල ගණන් යටතේ තක්සේරු කර ඇත

(ii) අභිජනන හා වාණිජමය කුකුළන්

(අ) බිත්තර දමන කාණ්ඩය ( බිත්තර දැමීම ආරම්භ වූ පසු)

පැටවුන්ගේ මිල හා විකිණීම සඳහා බිත්තර ලබා ගැනීමට ඇති කිකළියන්ගේ බිත්තර දැමීම ආරම්භය දක්වා වියදම, බිත්තර දැමූ කාලය අදළ කොටස ලියා හැරීමෙන් පසුව ඉතිරිය දක්වා ඇත .

(ආ) අභිජනන හා වාණිජමය බිත්තර ලබා ගන්නා වැඩෙන කුකුළ් කාණ්ඩ ( බිත්තර දැමීම ආරම්භයට පෙර)

නියමිත දින දක්වා මෙම කාණ්ඩ සඳහා දරන ලද වියදම සත්‍ය පිරිවැය වශයෙන් තක්සෙරු කර ඇත

(iii) අභිජනන බිත්තර (රක්කන බිත්තර)

පහත සඳහන් සූත්‍රය භාවිතා කරමින් අභිජනන බිත්තර පිරිවැය මත තක්සෙරු කර ඇත .

මුළු පිරිවැය, දෙසැම්බර් මාසයේ හැකි නිෂ්පාදිත බිත්තර ප්‍රමාණයෙන් බෙදීම

සත්ව ආහාර වල පිරිවැය සෘජු වේතන හා ක්‍ෂයවීම ඇතුලත් පොදු වියදම මෙහි සඳහන් කර ඇති මුළු පිරිවැය යන්නට ඇතුලත්ය.

(iv) වාණිජමය බිත්තර

අලෙවි සැලෙහි උපලබ්ධි වූ මිලට වාණිජමය බිත්තර තක්සේරු කර ඇත .

(v) නොමේරූ බ්‍රොයිලර් සහ ලේයර් තොග

එදිනට දරන ලද පිරිවැය මත තොග අගය කර ඇත .

(vi) ශීත කාමරවල ඇති බ්‍රොයිලර්

උපලබ්ධි වූ මිලට ශීත කාමරවල ඇති බ්‍රොයිලර් අගය කර ඇත .

(vii) පොල් හා කෘෂි නිෂ්පාදන

උපලබ්ධි වූ මිලට පොල් හා කෘෂි නිෂ්පාදන තොග අගය කොට ඇත .

(viii)පොල් කටු අඟුරු

උපලබ්ධි වූ මුදලෙන් 50% ක වටිනාකමට පොළව යට ඇති පොල් කටු අඟුරු අගය කොට ඇත .

(iX) අනෙක් තොග

අවම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට අනෙක් තොග අගය කොට ඇත .

2.2.2වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල්

ඇස්තමේන්තු උපලබ්ධි මිලෙන් බොල් හා අඩමාන ණය අඩුකිරීමෙන් පසු ලැබිය යුතු මුදල සටහන් කර ඇත

2.2.3 මුදල් හා මුදලට සමාන දෑ

අත ඉතිරි මුදල් , ඉල්ලුම් තැනපතු ඉතා ඉක්මනින් මුදල් බවට පත් කල හැකි ආයෝජන, වටිනාකමේ සැලකිය යුතු අවදානමක් නොමැති මුදල් බවට පරිවර්තනය කල හැකි හඳුනාගත් මුදල් යනාදි මුදල් හා මුදල්මය දෑ වශයෙන් අර්ථ නිරූපනය කර ඇත.

2.2.4 දේපල, පිරියත හා උපකරණ

(අ ) පිරිවැය

දේපල, පිරියත හා උපකරණ වටිනාකම එහි පිරිවැය මිලෙන් සම්මුච්චිත ක්ෂය අඩුකර දක්වා ඇත.

(ආ ) ප්‍රතිසංස්කරණ පිරිවැය

එහි මුල් ක්‍රියාකාරී තත්ත්වයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනිමට දේපල, පිරියත හා උපකරණ ප්‍රතිසංස්කරණය හෝ පවත්වාගෙන යාම සඳහා කරන ලද වියදම් එය දරණ ලද අවස්ථාවේ වියදම් ලෙස සටහන් කර ඇත.

(ඇ ) ක්ෂය කිරීම්

ඉඩම් හැර, දේපල , පිරියත උපකරණ සඳහා සරල මාර්ග ක්‍රම භාවිතා කරමින් ක්ෂය වෙන් කිරීම් ගණනය කර ඇති අතර, ප්‍රයෝජනවත් ජීවිත කාලය තුලදී සමාන වාරික වලින් පිරිවැය ලියා හැරීම සඳහා පහත සඳහන් ඇස්තමේන්තුගත වාර්ෂික ක්ෂය ප්‍රතිශතයන් ප්‍රයෝජනයට ගෙන ඇත.

| | වාර්ෂික ප්‍රතිශතයන් % |
|---|---|
| ගොඩනැගලි | 5 % |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 10% |
| මාර්ග හා ප්‍රවාහන | 20% |
| ලි බඩු හා සවිකිරීම් | 10% |
| කාර්යාල හා උපකරණ | 20% |
| පශු සම්පත් මඩු ඇතුලත් නිර්මාණ | 20% |
| වතු උපකරණ | 25% |

(ඈ) පශු සම්පත් මඩු සඳහා කරන ලද වියදම එම වියදම දරණ ලද වර්ෂය අග දි ප්‍රාග්ධනිත කර ඊළඟ වසර පහ තුල දී ලියා හරින ලදී .

(ඈ) වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම

වත්කම් ප්‍රත්‍යාගණනය ගිණුම් වලට ඇතුලත් කර නොමැත.

2.2.5 ආයෝජන

(අ) දීර්ඝ කාලීන ආයොජන

දීර්ඝ කාලීන ආයොජන පිරිවැය මත පෙන්නුම් කර ඇත.

උප සමාගමේ ප්‍රාග්ධනයෙන් 51 % ක කොටස් අත්කර ගැනිම සඳහා කරන ලද වියදම දිගු කාලින ආයෝජන වල පිරිවැයයි. ( ගිණුම් සඳහා වූ අංක 11 සටහන බලන්න )

2.2.6 එල දරණ වගාව

වර්තමාන මූල්‍ය කාලයේ එල දරණ අවධිය දක්වා වගාව ස්ථාපිත කිරීම සඳහා ගිය වියදම් ප්‍රාග්ධනිත කරණ ලදී.

බැරකම් හා වෙන්කිරීම්

2.3.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

(අ) නියම කරන ලද ප්‍රතිලාභ සැලසුම් (පාරිතෝෂික)

අදළ ව්‍යාස්ථාපිත නීති යටතේ සේවකයිනට පාරිතෝෂික ගෙවීමට මණ්ඩලය බැඳී සිටී. මෙම වගකීම සම්පූර්ණ කිරීම සඳහා සේවකයෙකු සේවයට බැඳුණු මුල් වර්ෂයේ සිට සේවය කරන ලද සෑම වර්ෂයකටම මාස භාගයකට සමාන මුදලක් අවසාන මාසයේ ලබාගත් වැටුප පදනම් කරගෙන සෑම සේවකයෙකු වෙනුවෙන්ම බැරකම් යටතේ වෙන්කිරීම් ලෙස ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙනගිය ශේෂයක් ලෙස පෙන්නුම් කර ඇත. වර්ෂය අවසානයට ගණනය කරන ලද මුදල හා වර්ෂය මුල දී ඉදිරියට ගෙනෙන ලද මුදල අතර වෙනස මණ්ඩලයේ වියදම් ලෙස සටහන් කර ඇත.

පාරිතෝෂික දීමනා අරමුදල ලෙස සටහන් නොවේ. එය වෙන් කිරීම් ලෙස බැරකම් යටතේ ශේෂ පත්‍රයේ දක්වා ඇත.

(ආ) නියම කරන ලද දයක සැලසුම්- සේවක අර්ථසාදක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සේවක පාරිතෝෂික හා සේවක භාරකාර අරමුදලට දයක වීම සේවකයින්ගේ අයිතිවාසිකමකි.

(ඇ) වගකීම් යටතේ ජංගම වගකීම් ලෙස දැක්වෙන්නේ ශේෂ පත්‍ර දිනට වර්ෂයක් තුළ ගෙවීම් සඳහා අසමත් වූ බැරකම් ය. ජංගම නොවන වත්කම් ලෙස දැක්වෙන්නේ ශේෂ පත්‍ර දිනට වර්ෂයක් ඉක්මවා ගොස් ඇති ගෙවීමට අසමත් වූ බරකම්ය. මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කිරීමේ දී සියළුම ජංගම නොවන වත්කම් ඇතුලත් කොට ගණනය කර ඇත.

2.3.2 ආදායම හැඳින්වීම

සත්‍ය වශයෙන් මැනිය හැකි දරණ ලද හා දැරීමට ඇති මුළු පිරිවැය සම්න්ධයෙන් ආර්ථික ප්‍රතිලාභ ලැබෙන ආදයම් ප්‍රභවයන් ආදයම් ලෙස හඳුන්වා ඇත . වෙළඳ වට්ටම් හා බදු අඩුකිරීමෙන් පසු ලැබුණ හෝ ලැබිය යුතු ශුද්ධ ආදයම සාධාරණ වටිනාකමට ගණනය කර ඇත . ආදයම හැඳින්වීම සඳහා පහත සඳහන් මිනුම් භාවිතා කර ඇත.

(අ ) භාණ්ඩ විකිණීම

සාමාන්‍යයෙන් භාණ්ඩවල අයිතියෙහි පාලනය දිගින් දිගටම පවත්වා ගනිමින් හෝ විකුණන ලද භාණ්ඩවල ප්‍රබල පාලනයක් තබා ගනිමින් භාණ්ඩවල අයිතිය හා සැලකිය යුතු අවදනම ගැණුම්කරුට මාරු කරමින් භාණ්ඩ විකිණීමෙන් ලැබුණු ආදයම් හඳුන්වා ඇත.

(ආ) පොලි ආදයම්

වත්කමේ ක්‍රියාකාරී ප්‍රතිඵල මත කාලයට අනුපාතිකව පොලී ආදයම ගිණුම් ගත කර ඇත.

(ඇ) කුලි ආදයම්

ලැබිය යුතු පදනම මත කුලි ආදයම් හඳුන්වා ඇත.

(ඈ) වෙනත්

ලැබිය යුතු පදනම මත වෙනත් ආදයම් හඳුන්වා ඇත. දේපළ පිරියත උපකරණ හා අනෙකුත් ජංගම නොවන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබුණු මුදලින් වත්කම් පවත්වා ගෙන ගිය මිල හා විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු ලැබුණු ශුද්ධ අතිරික්තය හා පාඩුව ආදයම් ප්‍රකාශණ වල ගිණුම් ගත කර ඇත

2.3.3 රජයේ ප්‍රදාන

(අ) ආදායම් ක්‍රමය

මණ්ඩලයේ ප්‍රධාන පරමාර්ථය ලෙස ගොවීන්ට සහනදායී මිලකට අභිජනනය සඳහා පශු සම්පත් නිකුත් කිරීමට සිදුව ඇති බැවින් අයභාර ආදායම් හෝ විලම්භිත අයභාර ආදායම් ලෙස සැලකිය හැකි සංවර්ධන කටයුතු වලට අදාල රජයේ ප්‍රදානයන් ප්‍රාග්ධන ලැබීම් යටතේ ගිණුම් ගත කර ඇත.

(ආ) ප්‍රාග්ධන ක්‍රමය

රජයෙන් කරන දිරිගැන්වීමක් ලෙස සලකා ප්‍රාග්ධන වත්කම් සඳහා ලැබුණු රජයේ ප්‍රදානයන් ප්‍රාග්ධන ලැබීම් යටතේ ගිණුම් ගත කර ඇත.

2.3.4 වියදම් හැඳින්වීම

(අ) අදාළ අයිතමයේ ආදායමට සෘජුව බලපාන ලද වියදම ආදායම් ප්‍රකාශණ වල වියදම් ලෙස සඳහන් කර ඇත. ව්‍යාපාරය පවත්වා ගෙන යාමට හා පිරියත හා උපකරණ ක්‍රියාකාරීව හා කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වාගෙන යාමට දරණ ලද සියළුම වියදම් වර්ෂයේ ලාභය ලබාගැනීමට දායක වූ ලෙස ආදායම් ප්‍රකාශණ වල ඇතුලත් කර ඇත.

(ආ)ආදායම් ප්‍රකාශණ ඉදිරිපත් කිරීමේදී වියදම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය දැක්වෙන පරිදි ඉදිරිපත් කිරීම තරමක් අවශ්‍ය බව අධ්‍යක්ෂවරුන් ගේ අදහස වන බැවින් එකී ආකාරයට ඉදිරිපත් කිරීම් සිදු කර ඇත.

2.3.5 මුල්‍ය ප්‍රකාශණ වල හෙළදරව් කළ යුතු ප්‍රමාණාත්මක ගැලපීම් ශේෂ පත්‍ර දිනයෙන් පසු පැන නැගී නැත. සීමාසහිත ශ්‍රී ලංකා ලිබියානු කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරා ගත යුතු යයි කැබිනට් මණ්ඩලය තීරණය කර ඇත.

සන්සන්දනාත්මක දත්තයන්

සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලට ගැලපෙන සේ සමහර සන්සන්දනාත්මක දත්තයන් නැවත වර්ගීකරණය කර ඇත.

3. අසම්භාව්‍ය බැරකම්

මණ්ඩලයට එරෙහිව පුද්ගලයින් විසින් පවරන ලද හා පුද්ගලයින්ට එරෙහිව මණ්ඩලය විසින් පවරන ලද නඩු සඳහා මණ්ඩලය වෙනුවෙන් රජයේ නීතිපති වරයා පෙනී සිටින මෙම නඩු මෙම අවස්ථාවේ දී තක්සේරු කළ හැකි තත්ත්වයක නොපැවතිමෙන් අසම්භාව්‍ය බැරකමක් ලෙස මුල්‍ය ප්‍රකාශණ වල ගැලපීමක් සිදු කර නොමැත.

4. අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම් බැඳියාවන්

ශේෂ පත්‍ර දිනයට මණ්ඩලය සමග සෘජු හෝ සෘජු නොවන කිසිදු ගිවිසුමකට අධ්‍යක්ෂවරුන් එළඹ නැත.

5. පිරිවැටුම

වර්ෂය තුළ මණ්ඩලය විසින් ඉන්වොයිස් කොට විකුණන ලද ද්‍රව්‍යයන් ගේ වටිනාකම පිරිවැටුමෙන් පෙන්නුම් කෙරේ.

| | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. | 31.12.2010 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|
| විකුණුම් | 1,441,363,755 | 1,234,533,833 |
| අඩුකළා ගොවිපළවල් අතර විකුණුම් | (209,405,037) | (134,811,536) |
| | 1,231,958,718 | 1,099,722, 297 |

6. වෙනත් මෙහෙයුම් ආදායම්

| | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. | 31.12.2010 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|
| බදු කුලී ආදායම | 2,505,039 | 2,176,854 |
| සේවක ණය පොලී ආදායම | 2,805,984 | 2,467,350 |
| බැංකු තැන්පත් පොලී ආදායම | 827,529 | 3,398,188 |
| සුළු ව්‍යාපෘති ආදායම/පාඩුව | 999,263 | 1,667,681 |
| ඩිලයිට් ව්‍යාපෘතිය | 629,121 | - |
| නැවුම් කිරි බෙදහැරීමේ ව්‍යාපෘතිය | 4,243,781 | - |
| වෙනත් ආදායම් | 17,957,324 | 9,915,291 |
| | 29,968,042 | 19,625,364 |

7. මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලත් ලාභය

පහත සඳහන් අයිතමයන් මෙහෙයුම් වලින් ක්‍රියාකාරකම් වලින් ලත් ලාභය ගණනය කිරීමේ දී අඩු කර ඇත

| | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. | 31.12.2010 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|
| ක්ෂය කිරීම් | 32,345,576 | 32,218,289 |

8. බදුකරණය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පණතේ විධි විධානයන්ට අනුව, බදු බැඳියාව සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කරගෙන මුදල් වෙන් කිරීම් සිදු කර ඇත.

9. ආයෝජන

උප සමාගම්වල ආයෝජනය - රු 15 995 771

1995 දී ශ්‍රී ලංකා ලිබියානු කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන සමාගමෙහි, ඉල්ලුම් නොකරන ලද ආයෝජන වල රු.15,995,770.61 ක් මණ්ඩලය විසින් ආයෝජනය කර ඇත. උප සමාගමෙන් 51% ක් මණ්ඩලය හිමි කර ගෙන ඇත. පිරිවැය ගිණුම්කරණ ක්‍රමය යටතේ මෙම ආයෝජනය ගිණුම් කොට ඇත.

සටහන 11(1)= ශ්‍රී ලංකා ලිබියානු කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන සමාගමෙහි ආයෝජනය කරන ලද අරමුදල් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 26 ප්‍රකාර ගිණුම් කොට ඇත.

11 වෙනත් වත්කම්

| | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. | 31.12.2010 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|
| විලම්බිත වියදම් | 391,162,637 | 325,188,669 |
| කල් බදු වත්කම් මත විලම්බිත අයභාර ආදායම් | (44,016,502) | (45,017,007) |
| පශු සම්පත් තොග | 240,321,969 | 201,647,728 |
| එශු සමපත් එළු හා ගව බැංකුව | 1,583,770 | - |
| | 589,051,874 | 481,819,391 |

## 12 දීර්ග කාලීන වත්කම්

| | | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. | 31.12.2010 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|---|
| දීර්ග කාලීන ණය | (12 අ) | 102,662,700 | 117,134,489 |
| මූල්‍ය බදු මත වගකීම් | (12 ආ) | - | 729,164 |
| මූල්‍ය බදු මත වගකීම් | (12 ඇ) | 25,511,667 | - |
| | | 128,174,367 | 117,863,653 |

## 12 අ දීර්ග කාලීන ණය

| ණය හිමියා | ණය මුදල | අරමුණ | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. | 31.12.2010 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|---|---|
| ගොවීන්ගේ භාරකාර අරමුදල | මිලියන 102 6 | ප්‍රාග්ධන වියදම් | 102,662,700 | 102,662,700 |
| මහජන බැංකුව | මිලියන 220 | සෙලාන් බැංකු ණය ගෙවීම | | 14,471,789 |
| | | | 102,662,700 | 117,134,489 |

## 12 ආ මූල්‍ය කල් බදු මත වගකීම්

| | 31.12.2011 රුපියල් | 31.12.2011 රුපියල් |
|---|---|---|
| මහජන බැංකුව - කල් බද්ද | 1,979,164 | 3,229,167 |
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | (1,250,027) | (1,250,003) |
| අඩු කළා ආපසු ගෙවීම් | 729,137 | 1,979,164 |
| අඩු කළා වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල | (729,137) | (1,250,000) |
| වර්ෂය අවසානයේ ද ඇති ශේෂය | - | 729,164 |

## 12 ඇ මූල්‍ය කල් බදු මත වගකීම්

| ලංකා බැංකුව - කැබ්රථ සඳහා වූ කල් බදු | 31.12.2011 රුපියල් | 31.12.2011 රුපියල් |
|---|---|---|
| දුන් මුදල | 28,906,800 | - |
| අඩු කළා:ආපසු ගෙවීම් | (3,083,392) | - |
| | 25,823,408 | - |
| අඩු කළා:වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල | (4,900,000) | - |
| අඩු කළා:වර්ෂයක් තුළ කල්බදු මත අනාගත මූල්‍ය ගාස්තු | (881,360) | - |
| අඩු කලා:වර්ෂයකට වැඩි මූල්‍ය කල්බදු මත අනාගත මූල්‍ය ගාස්තු | (3,055,381) | - |
| වර්ෂය අවසානයේ දී ඇති ශේෂය | 16,986,667 | - |

| ලංකා බැංකුව - මෝටර් රථ (කාර්) සඳහා වූ කල් බදු | 31.12.2011 රුපියල් | 31.12.2011 රුපියල් |
|---|---|---|
| දුන් මුදල | 12,978,600 | - |
| අඩු කළා:ආපසු ගෙවීම් | (324,465) | - |
| | 12,654,135 | - |
| අඩු කළා:වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල | (2,200,000) | - |
| | (395,720) | - |
| අඩු කළා:වර්ෂයක් තුළ කල්බදු මත අනාගත මූල්‍ය ගාස්තු | 1,533,415 | - |
| අඩු කලා:වර්ෂයකට වැඩි මූල්‍ය කල්බදු මත අනාගත මූල්‍ය ගාස්තු | 8,525,000 | - |
| වර්ෂය අවසානයේ දී ඇති ශේෂය | 25,511,667 | |

## 13 මහ භාණ්ඩාගාරයේ ණය

| | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. | 31.12.2010 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|
| මහ භාණ්ඩාගාරයේ ණය | 50,000,000 | 50,000,000 |
| | 50,000,000 | 50,000,000 |

## 14 විලම්බිත වගකීම්

| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. | 31.12.2010 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ දී ඇති ශේෂය | 166,466,691 | 154,442,001 |
| වර්ෂය තුළ ගෙවූ මුදල | 16,602,511 | 29,906,056 |
| | 183,069,202 | 184,348,057 |
| අඩු කළා ගෙවීම් | (16,634,695) | (17,881,366) |
| වර්ෂය අවසානයේ දී ඇති ශේෂය | 166,434,507 | 166,466,691 |

## 15 වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු ණය

| | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. | 31.12.2010 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|
| වෙළඳ ණය හිමියන් | 210,527,092 | 179,049,066 |
| උපචිත වියදම් | 30,527,417 | 31,214,561 |
| අනෙකුත් ණය | 40,525,138 | 38,802,254 |
| වර්ෂය අවසානයේ දී ඇති ශේෂය | 281,579,647 | 249,065,881 |

## 10 දේපළ,පිරියත හා උපකරණ

| වියදම් | ඉඩම් රුපියල් | ගොඩනැගිලි රුපියල් | යන්ත්‍ර හා උපකරණ රුපියල් | වතු උපකරණ රුපියල් | කාර්යාල උපකරණ රුපියල් | ලී බඩු හා සවිකිරීම් රුපියල් | ඉදිකිරීම් රුපියල් | මෝටර් රථ රුපියල් | නොනිමි වැඩ රුපියල් | එකතුව රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 338,642,967 | 99,834,575 | 50,845,418 | 41,870,456 | 11,965,605 | 5,326,134 | 159,164,450 | 57,214,501 | 2,932,872 | 767,796,978 |
| එකතු කිරීම් | 5,787,714 | 37,961,608 | 5,143,200 | 2,447,978 | 6,987,426 | 530,108 | 28,809,997 | 51,415,440 | 25,848,048 | 161,931,518 |
| විකුණුම් | - | - | (2,968) | (1,032,256) | (24,156) | - | - | (251,106) | - | (1,310,486) |
| නොනිමි වැඩ | - | - | - | - | - | - | - | - | (2,932,872) | (2,932,872) |
| ගැලපුම් | - | - | - | - | (53,999) | - | (31,500) | - | - | (85,499) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 344,430,681 | 137,796,183 | 55,985,650 | 43,286,178 | 18,874,877 | 5,856,242 | 187,942,947 | 108,378,835 | 25,848,048 | 928,399,639 |
| **සම්මුචිත ක්ෂය** | | | | | | | | | | |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | - | 42,464,262 | 18,595,258 | 31,657,201 | 8,260,828 | 2,237,301 | 113,330,496 | 51,778,044 | - | 268,323,392 |
| වාර්ෂික ක්ෂය | - | 3,774,724 | 4,935,026 | 4,701,096 | 1,201,401 | 497,614 | 15,472,202 | 1,763,512 | - | 32,345,576 |
| විකුණුම් | - | - | (2,233) | (1,032,256) | (24,156) | - | - | (251,106) | - | (1,309,751) |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 46,238,986 | 23,528,051 | 35,326,041) | 9,438,074 | 2,734,915 | 128,802,699 | 53,290,450 | - | 299,359,217 |
| **ක්ෂය අඩුකල අගය** | | | | | | | | | | |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 344,430,681 | 91,557,196 | 32,457,599 | 7,960,137 | 9,436,803 | 3,121,327 | 59,140,248 | 55,088,385 | 25,848,048 | 629,040,422 |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 338,642,967 | 57,370,313 | 32,250,161 | 10,213,254 | 3,704,777 | 3,088,833 | 45,833,954 | 5,436,456 | 2,932,872 | 499,473,586 |

## 2011 දෙසැම්බර් 31 දිනට විස්තරාත්මක ලාභාලාභ ගිණුම

| | | 31.12.2011 දිනෙන් අවසන් වූ වර්ෂය රුපියල් | 31.12 2010.දිනෙන් අවසන් වූ වර්ෂය රුපියල් |
|---|---|---|---|
| විකුණුම් | | 1,441,363,755 | 1,234,533,833 |
| අඩු කළා:අන්තර් ගොවිපොල විකුණුම් | | (209,405,037) | (134,811,536) |
| | | 1,231,958,71 | 1,099,722,297 |
| විකුණුම් පිරිවැය | | (871,843,346) | (797,818,226) |
| දළ ලාභය | | 360,115,372 | 301,904,071 |
| එකතු කළා: මෙහෙයුම් ආදයම් | (ඇමුණුම 1) | 29,968,042 | 19,625,364 |
| රජයේ ප්‍රදන | (ඇමුණුම 2) | 1,187,500 | 5,125,000 |
| | | 391,270,914 | 326,654,435 |
| අඩු කළා:වියදම් | | | |
| බෙදාහැරීමේ වියදම් | (ඇමුණුම 3) | 4,382,003 | 3,574,785 |
| පරිපාලන වියදම් | (ඇමුණුම 4) | 121,766,384 | 107,912,043 |
| අනෙකුත් වියදම් | (ඇමුණුම 5) | 1,414,972 | 2,279,651 |
| මුල්‍ය වියදම් | (ඇමුණුම 6) | 14,017,242 | 28,695,065 |
| | | (141,580,600) | (142,461,545) |
| වත්කම් විකිණීමෙන් ලත් ලාභය | (ඇමුණුම 7) | 504,845 | 3,129,328 |
| **බදු පෙර ශුද්ධ ලාභය** | | 250,195,158 | 187,322,219 |

# විස්තරාත්මක ලාභාලාභ ගිණුම සඳහා වූ උප ලේඛණ

| | 31.12.2011 දිනෙන් අවසන් වූ වර්ෂය රුපියල් | 31.12.2011 දිනෙන් අවසන් වූ වර්ෂය රුපියල් |
|---|---|---|
| **ඇමුණුම 1** | | |
| **මෙහෙයුම් ආදයම්** | | |
| කුලී කල් බදු මත ආදයම | 2,505,039 | 2,176,854 |
| සේවක ණය මත ආදයම | 2,805,984 | 2,467,350 |
| තැන්පතු මත ආදයම | 827,529 | 3,398,188 |
| කුඩා ව්‍යාපෘති මත ලාභය (අලාභය) | 999,263 | 1,667,681 |
| ඩිලයිට් ව්‍යාපෘතිය | 629,121 | (374,681) |
| නැවුම් කිරි බෙද හැරීමේ ව්‍යාපෘතිය | 4,243,781 | (8,002,380) |
| අනෙකුත් ආදයම් | 17,957,324 | 9,915,291 |
| | 29,968,042 | 11,248,303 |
| **ඇමුණුම 2** | | |
| **රජයේ ප්‍රදාන** | | |
| නැවුම් එළකිරි ප්‍රචලිත කිරීම | 1,187,500 | 5,125,000 |
| කළල බද්ධ ව්‍යාපෘතිය | - | - |
| | 1,187,500 | 5,125,000 |
| **ඇමුණුම 3** | | |
| **බෙදහැරීමේ වියදම්** | | |
| තැරුවි ගාස්තු | 4,382,003 | 5,125,000 |
| විකුණුම් සංවර්ධනය | - | - |
| | 4,382,003 | 5,125,000 |
| **ඇමුණුම් 4** | | |
| **පරිපාලන වියදම්** | | |
| පරිපාලනය සහ ගොවිපොළ නඩත්තුව | 21,908,098 | 13,722,226 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 8,000,000 | 8,206,000 |
| ප්‍රධාන කාර්යාලය | 91,858,286 | 85,983,817 |
| | 121,766,384 | 107,912,043 |
| **ඇමුණුම 5** | | |
| **වෙනත් වියදම්** | | |
| බඩ ඉරිඟු වගාව | 1,414,972 | 2,279,651 |
| නැවුම් එළකිරි බෙදහැරීමේ ව්‍යාපෘතිය | - | - |
| ඩිලයිට් ව්‍යාපෘතිය | - | - |
| | 1,414,972 | 2,279,651 |
| **ඇමුණුම 6** | | |
| **මූල්‍යමය වියදම්** | | |
| බැංකු ගාස්තු | - | 1,877,226 |
| ණය පොලී | 3,123,876 | 6,212,862 |
| කල්බදු පොලී | 519,524 | - |
| වෙනත් ණය මත පොලී | 10,266,270 | 10,266,270 |
| බැංකු අයිරා පොලී | 107,572 | 10,338,708 |
| | 14,017,242 | 28,695,065 |
| **ඇමුණුම 7** | | |
| වත්කම් විකිණීමෙන් ලත් ලාභය | 504,845 | 3,129,328 |
| ජංගම නොවන වත්කම් අලෙවිය | 504,845 | 3,129,328 |

## ශේෂ පත්‍රය සඳහා වූ උප ලේඛණ

1 විලම්බිත වියදම්- රු 391,162, 637

| | පොල් යටි වගා සහ නැවත වගා රු. | තෘණ ස්ථාපන වියදම් රු. | කජු වගාකිරීමේ වියදම් රු. | රබර් වගාකිරීමේ වියදම් රු. | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|---|---|---|
| 01.01.2011 දිනට ශේෂය | 312,446,497 | 6,944,773 | 1,335,382 | 4,462,017 | 325,188,669 |
| 2011 වර්ෂය තුළ දැරූ වියදම් | 55,111,648 | 22,424,046 | - | 1,104,340 | 78,640,034 |
| ලාභාලාභ ගිණුමට හර කළ ප්‍රමාණය | (3,687,298) | (8,978,767) | - | - | (12,666,066) |
| 31.12.2011 දිනට ශේෂය | 363,870,846 | 20,390,052 | 1,335,382 | 5,566,358 | 391,162,637 |

2 කල්බදු වත්කම් මත විලම්බිත ආදායම්- රු 44,016,502

| | | | 31.12.2011 දිනෙන් අවසන් වූ වර්ෂය රුපියල් |
|---|---|---|---|
| 01.01.2011 දිනට ශේෂය | | | 45,017,007 |
| ආදායමට මාරු කිරීම | - | සී/ස ලන්ලිබ් සමාගමේ කල්බදු | (88,384) |
| ආදායමට මාරු කිරීම | - | සී/ස ග්‍රන්ඩ්ක්ස් සමාගමේ කල්බදු | (666,666) |
| ආදායමට මාරු කිරීම | - | සී/ස රජවැල්ල හෝල්ඩින් | (245,455) |
| 31.12.2011 දිනට ශේෂය | | | 44,016,502 |

3 පශු සම්පත් අගය- රු 318,552,393

| | ප්‍රාග්ධන | වෙළඳ | එකතුව |
|---|---|---|---|
| එළ ගව මී ගව | 245,252,020 | 8,493,200 | 253,745,220 |
| එළුවන් | 4,324,850 | 193 520 | 4,518,370 |
| ඌරන් | 5,272,177 | 1,786,502 | 7,058,679 |
| බැටළුවන් | 11,920,855 | - | 11,920,855 |
| හාවුන් | - | - | - |
| කුකුළන් | 4,140,777 | 773,621 | 40,914,398 |
| වටුවන් | - | 35,630 | 35,630 |
| තාරාවුන් | 3,771 | 9,915 | 13,686 |
| කළුකුන් | 99,995 | 660 | 100,655 |
| වෙනත් | - | 244 900 | 244,900 |
| | 307,014,444 | 11,537,948 | 318,552,393 |
| 25% අඩු කිරීම් | 66,692,475 | 2,618,306 | 69,310,781 |
| ශුද්ධ ලාභය | 240,321,969 | 8,919,643 | 249,241,612 |

4 31.12.2011 දිනට වෙළඳ හා වෙනත් තොග- රු 197 347 491

| | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|
| පොල් හා කොප්පරා | 106,508,581 |
| විවිධ නිෂ්පාදන තොග | 6,537,736 |
| ගොවිපළ හා ප්‍රධාන කාර්යාලයේ වෙනත් තොග | 75,381,531 |
| පශු සම්පත් වෙළඳ | 8,919,643 |
| | 197,347,491 |

5 වෙළඳ ණය ගැතියෝ සහ වෙනත් ලැබිය යුතු දෑ- රු 178,721,439

| | | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|
| වෙළඳ ණය ගැතියෝ | උප ලේඛණ 5.1 | 82,359,158 |
| තැන්පතු හා අත්තිකාරම් | උප ලේඛණ 5.2 | 14,384,805 |
| වෙනත් ලැබිය යුතු දෑ | උප ලේඛණ 5.3 | 57,762,366 |
| වෙනත් ජංගම වත්කම් | උප ලේඛණ 5.4 | 24,215,111 |
| | | 178,721,439 |

### 5.1 වෙළඳ ණය ගැතියෝ - රු 82,359,158

| | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|
| වෙළඳ ණය ගැතියෝ | 98,352,604 |
| අඩු කළා:බොල් ණය සඳහා වෙන්කිරීම් | (15,993,446) |
| | රු 82,359,158 |

### 5.2 තැන්පතු පෙර ගෙවුම් හා අත්තිකාරම් - රු.14,384,805

| | |
|---|---|
| තැන්පතු | 13,170,744 |
| පෙර ගෙවුම් | 1,214,061 |
| | රු.14,384,805 |

### 5.3 වෙනත් ලැබිය යුතු දෑ - රු.57,762,366

| | |
|---|---|
| සේවක ණය | 33,837,348 |
| ආර්ථික සේවා ගාස්තු | 19,186,020 |
| දේශීය ආදායම් බදු | - |
| ආපසු ඉල්ලුම් කළ හැකි වැට් | 4,738,999 |
| | රු.57,762,366 |

### 5.4 වෙනත් ජංගම වත්කම් - රු.24,215,111

| | |
|---|---|
| තවාන් කටයුතු වී වගාව වැනි ගොවිපොළ වල නොනිමි ක්‍රියාකාරිත්වයන් සඳහා දරණ ලද වියදම් | 24,215,111 |
| | රු.24,215,111 |

### 6 මුදල් හා මුල්‍යමය දෑ - රු.46,428,054

| | |
|---|---|
| ඉල්ලුම් තැන්පත් මහජන බැංකුව- නාරාහේන්පිට | 25,709,796 |
| ස්ථිර තැන්පත්- ලංකා බැංකුව | 264,005 |
| මහජන බැංකුව- ප්‍රධාන කාර්යාලය | 16,505,564 |
| ඉතිරි කිරීමේ ගිණුම | 6,069 |
| මුදල් ශේෂයන් | |
| අතැති මුදල් | 2,845,689 |
| අතැති මුද්දර | 43,137 |
| මාර්ගස්ථ මුදල් | 1,053,794 |
| | රු.46,428,054 |

### 7 ප්‍රාග්ධන සංචිත - රු 145,364,174

| | 31.12.2011 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|
| 01.01.2011 දිනට ශේෂය | 131,884,428 |
| දැයට කිරුළ | 1,667,246 |
| කුකුළ් පැටව් ආනයනය | 13,000,000 |
| කිරි අලෙවි හල් ක්‍රමක්ෂය | (1,187,500) |
| | 145,364,174 |

### 8 වෙළඳ ණය හිමියන් හා වෙනත් ගෙවිය යුතු ණය - රු.281,579,647

| | | |
|---|---|---|
| වෙළඳ ණය හිමියන් | උප ලේඛණ 8.1 | 210,527,092 |
| උපචිත වියදම් | උප ලේඛණ 8.2 | 30,527,417 |
| වෙනත් ගෙවිය යුතු ණය | උප ලේඛණ 8.3 | 40,525,138 |
| | | 281,579,647 |

8 1 වෙළඳ ණය හිමියන් - රු. 210,527, 092

| | |
|---|---|
| වෙළඳ ණය හිමියන් | 210, 527, 092 |
| | 210, 527, 092 |

8.2 උපචිත වියදම් - රු. 30,527, 417

| | |
|---|---|
| උපචිත වියදම් | 19,618,031 |
| සේවක අර්ථසාධක අරමුදල | 4,465,067 |
| සේ.නි.භා.අ. | 641,875 |
| ගෙවිය යුතු වැට් | 5,802,444 |
| | 30, 527, 417 |

8 3 වෙනත් ගෙවිය යුතු ණය - රු. 40 ,525, 138

| | |
|---|---|
| සේවක ණය හිමියන් | 15, 338, 229 |
| වෙන්කිරීම් | 8,506,993 |
| තැන්පත් | 16 ,679,917 |
| | රු.40, 525, 138 |

9 වර්ෂයක් තුළ ගෙවිය යුතු කාලීන ණය- රු. 19 ,681, 528

| | |
|---|---|
| මහජන බැංකුව - ගෙවිය යුතු ණය | 11, 852, 391 |
| මහජන බැංකුව - ගෙවිය යුතු ණය - ශීතකරණ ට්‍රක් රථය | 729, 137 |
| ලංකා බැංකුව - ගෙවිය යුතු ණය - කැබ්ස් | 4,900,000 |
| ලංකා බැංකුව - ගෙවිය යුතු ණය - මෝටර් රථ (කාර්) | 2,200,000 |
| | රු. 19, 681, 528 |

10 බැංකු අයිරාවන්- රු. 21,812, 323

| | |
|---|---|
| මහජන බැංකුව - 100153693183 | 20,272,180 |
| මහරගම - 100153694880 | 1,540,143 |
| | රු. 21,812,323 |